# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 11,633 — 1959 ජනවාරි 2 වැනි සිකුරාදා — 2.1.1959

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි)


# I වැනි කොටස : (II) වැනි ඡේදය—පලකිරීම්

(එක් එක් කොටස වෙන වෙනම බැඳ තබා ගත හැකි වීම පිණිස පිටු අංක යොදා ඇත්තේ වෙන වෙනම එක් එක් කොටසට ගැලපෙන පරිද්දෙනි)


| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු-ඇබෑර්තු ... — | 1 | තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... | — | ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... | — |
| වැන්ඩර් කැඳවීමේ දැන්වීම ... | 3 | රට බීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම්පත් | — |
| තීරණය කළ වැන්ඩර් පත් පිළිබඳ දැන්වීම | — | වෙන්දේසි කිරීම පිළිබඳ දැන්වීම ... | — |
| බඩු බාහිරාදිය විකිණීම ... — | — | විවිධ දැන්වීම — | — |


## තනතුරු—ඇබෑර්තු

### ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාළ වන පොදු කොන්දේසි

**දීමනා.**—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ ජීවන දීමනාව යන මෙම දීමනා, ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයෙන් සඳහන් කොට නැති අවස්ථාවන්හිදී, ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

2. **සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කායයීී සංවිධාන සංග්‍රහ රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධානවලට හෝ රෙගුලාසිවලට හෝ යටත් වන්නේ ය.

3. **සේවයට බාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවට කරන පත් කිරීම්වල දී (දවස් පඩි ලබන්නන් හැර) ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් සවකීය මනාපය පරිදි තවත් සියයට 5ක් ද ඊට එක් කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් ගෙව්වත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේ දී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7½කට සමාන වන මුදලක් ඒ අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත්වන්නන් විසින් "ඇප තැබිම කළ යුතුය" යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානයන් විසින් තීරණය කරනු ලැබුවහොත්, එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගේ (ඇප) ආඥාපනතට අනුකූල ව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම රාජ්‍ය සේවාවෙහි සිටින්නන්ට හැර සෙස්සන්ට, ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද, නැද්ද යනු පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

4. **නවප්‍රවේශක නිලධාරීහු.**—(i) විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරු වලට පත් කරනු ලබන "නවප්‍රවේශක නිලධාරීන්" සම්බන්ධයෙන්, කිසියම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියම කොට ඇති අවස්ථාවන්හිදී මිස, අන් හැම අවස්ථාවකදීම ආධුනික/පරීක්ෂා කාලය යථායෝග්‍ය පරිදි තුන් වර්ෂයක් වේ.

(ii) "නවප්‍රවේශක නිලධාරීන්" ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීමත් විශේෂයෙන්ම 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමත් සඳහා දැනට පනවා ඇති ව්‍යවස්ථාවලට මෙන් ම මින් මතු පනවනු ලබන ව්‍යවස්ථාවලට ද අනුකූල ව ක්‍රියා කළ යුතු වේ.

(iii) (අ) මෙම නිලධාරීන් සවකීය ආධුනික/පරීක්ෂා කාලය ඇතුළත සිංහල භාෂා විෂයෙහි ප්‍රවීණතාවක් ලබා ගත යුතු ය.

(ආ) සිංහල භාෂාව පිළිබඳ ප්‍රවීණතා පරීක්ෂණයකින් සමත්වීම, ආධුනික/පරීක්ෂා කාලය අවසන් වීමෙන් පසු එම නිලධාරීන්ගේ තනතුරු ස්ථිර කිරීම සඳහා අවශ්‍ය වන සුදුසුකම් අතුරින් එකක් වේ.

ආධුනික/පරීක්ෂා කාලය ඇතුළත සිංහල භාෂා විෂයෙහි ප්‍රවීණතාව සම්බන්ධයෙන් නියමිත වූ තත්ත්වයට එළඹීමට අසමත් වන අය තනතුරෙන් පහකරනු ලැබීමට ඉඩ තිබේ. එහෙත් "ඔවුන් රාජ්‍ය භාෂාව හැදෑරීමෙහි ලා අව්‍යාජ ප්‍රයත්නයක් දරා ඇත" යි ඔවුන් එම තනතුරුවලට පත් කළ බලධාරීන් විසින් පිළිගැණෙතොත්, එසේ තනතුරුවලින් පහ කිරීම ප්‍රමාද කිරීමට ඉඩ තිබේ. එබඳු වූ කිසියම් නිලධාරියකු නියමිත දිනයට පසු සෑහෙන කාල සීමාවක් ඇතුළත සිංහල භාෂා ප්‍රවීණතාව සම්බන්ධයෙන් පැවැත්වෙන පරීක්ෂණයකින් සමත් වුවහොත්, කලින් අසමත් වීම නිසා ඔහුට නැති වී ගිය ජ්‍යෙෂ්ඨත්වය නැවත ලබා දීම, එම කාර්යය පිළිබඳ නිසි බලධාරීහුගේ කැමැත්ත පරිදි සිදු වේ.


1—ජේ. ඇන්. බී 10439—6,496 (12/58)

5. කෘෂිකර්ම කටයුතු පිළිබඳ ප්‍රායෝගික පළපුරුද්ද (සහතික පිටපත් ඇමිණිය යුතුය. වත්තේ බිම් ප්‍රමාණය සඳහන් කරන්න.) :————.

6. යුද්ධ සේවයේ යෙදී සිටියේ නම් ඒ පිළිබඳ විස්තර : ————.

7. අමුණා ඇති සහතික වල ගණන :————.

8. අයදුම්කරුගේ චරිතය පිළිබඳ දැනීමක් ඇත්තවුන් දෙදෙනකුගේ නම් සහ ලිපිනයන් ඔවුන්ගේ තනතුරුත් : ————.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

අයදුම්කරු ලංකාවෙහි ඉපදුනි නම් (අ) සමග (ආ) හෝ (ඇ) හා (ඈ) දෙකම හෝ පිරවිය යුතුය. අයදුම්කරු ලංකාවෙහි නොඉපදුනි නම් (අ) සමග (ආ) හෝ (ඇ) දෙක හෝ (ඈ) දෙකම පිරවිය යුතුය.

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

### රජයේ අභ්‍යාස විද්‍යාලයයන්හි අත්කම් උපදේශිකා තනතුර

රජයේ අභ්‍යාස විද්‍යාලයයන්හි පූර්වෝක්ත තනතුරු සඳහා 1959.1. මස 23 වැනි දින වන තෙක්, කොම්පඤ්ඤවීදියේ මලයි විදියේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ, අධ්‍යාපනාධ්‍යක්ෂවරයා (ටී. සී. ශාඛාව) විසින් ඉල්ලුම් පත්‍ර භාරගනු ලැබේ.

**වැටුප් ක්‍රමය.**—මේ තනතුර සඳහා නියමිත වැටුප් ක්‍රමය රු. 834—42—1,296 කි.

**3. අවශ්‍ය අධ්‍යාපන හා අනික් සුදුසුකම් :—**

(i) ඉල්ලුම්කරුවන් කාර්මික ගුරු සහතික පත්‍රය (කුඹුල් වැඩ) හා කනිෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය හෝ ඊට සමාන සහතික පත්‍රයක් හෝ වඩා උසස් සහතික පත්‍රයක් ලබා සිටිය යුතු ය. ප්‍රතිරූප ආදර්ශ තැනීම ඇතුලු මැටි බඳුන් සෑදීම ඉගැන්වීමටද මෙහි පහත සඳහන් වන කර්මාන්ත ඉගැන්වීමටද ඔවුන්ට හැකියාවක් තිබිය යුතු ය ;

එනම් : පැදුරු විවීම ආදි ඇතුළු පෙට්ටි මළු වීවීම, කොහු වැඩ, පොත් බැඳීම, හම් වැඩ හා කැටයම් වැඩ ;

(ii) 1959.1.23 වැනි දිනට ඉල්ලුම් කරුවන් වයසින් අවුරුදු 22ට අඩු හෝ අවුරුදු 45ට වැඩි නො විය යුතු ය. රජයේ සේවයේ නියුක්ත නිලධාරීන් සම්බන්ධයෙන් ඉහළ වයස් සීමාව නො යෙදේ.

**4. විශෙෂ කොන්දේසි :—**

(i) තෝරාගනු ලබන ඉල්ලුම්කරු පළමුවරට පොල්ගොල්ල අභ්‍යාස විද්‍යාලයට පත් කරනු ලැබේ. එහෙත් වෙන ස්ථානයකට මාරු කරනු ලැබීමට යටත් වේ ;

(ii) ඉල්ලුම් පත්‍ර නියමිත පෝරමයෙහි පුරවා එවිය යුතු ය. ආදර්ශ පෝරමයක් මෙහි පහත දී තිබේ. මේ කාර්යාලයෙන් පෝරම නිකුත් කරනු නො ලැබේ. ඉල්ලුම් පත්‍ර පිළියෙළ කළ යුත්තේ මේ ආදර්ශ පෝරමය අනුව ය ;

(iii) පාඨශාලා ගුරු විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා යටතේ මෙම තනතුර විශ්‍රාම වැටුප් වලට හිමි ය. මෙම තනතුර සඳහා තෝරා ගැනීමට පෙර විශ්‍රාම වැටුප් පනත යටතේ ගුරුවරියකු වශයෙන් විශ්‍රාම වැටුප් හිමි තනතුරක් දරන ගුරුවරියකු පත් කරනු ලැබුවහොත්, ඇය මෙම තනතුර දරන තාක් මෙය විශ්‍රාම වැටුප්වලට හිමි යයි ප්‍රකාශ කරනු ලැබේ.

5. මේ ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡෙදයේ මුල පළකර තිබෙන රජයේ සේවයේ තනතුරුවලට පත් කිරීම සම්බන්ධයෙන් යෙදෙන සාමාන්‍ය කොන්දේසි ද බලනු මැනවි.

ඊ. එච්. ද අල්විස්,
අධ්‍යාපනාධ්‍යක්ෂ වෙනුවට.

අංක ටී. සී. සී. 2724,

1958 දෙසැම්බර් මස 27 වැනි දින,
කොළඹ, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ දී ය.

### ආදර්ශ පෝරමය

**පොල්ගොල්ලේ රජයේ අභ්‍යාස විද්‍යාලයේ අත්කම් උපදේශිකා තනතුර පිළිබඳ ඉල්ලුම් පත්‍රය**

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.
2. ලිපිනය :————.
3. 59.1.23 වැනි දිනට නිවැරිදි වයස : අවුරුදු——, මාස——, දින——.
4. ජාතිය හා එය ලබා ගත් අන්දම :————.
5. උපන් ස්ථානය—
   (අ) ඉල්ලුම්කරු :————.
   (ආ) ඇගේ පියා :————.
   (ඇ) ඇගේ පියාගේ පියා :————.
   (ඈ) ඇගේ පියාගේ පියාගේත් පියා :————.
6. ලබා ගත් දින සමග ශාස්ත්‍රීය සුදුසුකම් (ලබා තිබෙන උසස්ම අධ්‍යාපන සහතික පත්‍රවල පිටපතක් ඇමිණිය යුතු ය) : ————.
7. වෘත්තීය සුදුසුකම් :————.
8. ඉගෙනීම ලැබූ පාඨශාලා හා විද්‍යාල (ඇතුළත් වූ හා අස් වූ දින සඳහන් කළ යුතු ය.) :————.
9. දැනට යෙදී සිටින රක්ෂාව :————.
10. ඉගැන්වීමේ පළපුරුද්ද (මෙහි පහත දැක්වෙන පෝරමයෙහි විස්තර සඳහන් කරන්න)—
    (i) පාඨශාලාවේ හෝ විද්‍යාලයේ නම :————.
    (ii) ඇතුළත් වූ දිනය :————.
    (iii) අස් වූ දිනය :————.
    (iv) දැරූ තනතුර :————.
    (v) සේවා කාලය :————.
    (vi) අස්වීමට හේතුව :————.
    (vii) මුළු කාලය :————.
11. සිංහල භාෂාවෙන් ලබා තිබෙන සුදුසුකම් :————.
12. චරිත සහතික ලබා ගත් අයගේ (ඥාතීන් නොවෙයි) නම් හා නිලතල (සහතික තුනක පිටපත්, මුල් පිටපත් නොවෙයි.) ඇමිණිය යුතුය. රජයේ සේවකයන් සම්බන්ධයෙන් මෙය අනවශ්‍යය.
13. අනික් විස්තර :————.

ම විසින් මෙම ඉල්ලුම් පත්‍රයෙහි සඳහන් කරන්නට යෙදුන විස්තර සත්‍ය හා නිවැරදි බවට මෙයින් සහතික කරමි. මේ ඉල්ලුම් පත්‍රයෙහි යම්කිසි අසත්‍ය හෝ වැරදි දෙයක් තිබෙන බව තෝරීමට කලින් අනාවරණය වුවහොත් මා එයින් ම නුසුදුසු බවට ඇමිණෙනවා පමණක් නොව, තෝරීමෙන් පසු ඒ බව දැන ගන්නට ලැබුනොත්, කිසිම වන්දියක් රහිතව, මා රාජකාරියෙන් පහ කර දැමීමට යටත් වන බවද මම දනිමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

භාණ්ඩාගාරයේ අංකය : 1/83/4 (ජී)

**ස්ථාන මාරුව සහිත ලඝු ලේඛක සේවයේ පහළ පංතියට අයත් ලඝු ලේඛකයන්ගේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය (සිංහල)—ඔක්තෝබර්, 1958**

1958 ඔක්තෝබර් මස 18 වැනි දින පවත්වනු ලැබූ ස්ථාන මාරුව සහිත ලඝු ලේඛක සේවයේ පහළ පංතියට අයත් ලඝු ලේඛකයන්ගේ වාර්ෂික වේතනය රුපියල් 2,940ක් වීමට පෙර කාර්යක්ෂමතා කඩ ඉමෙන් සාමර්ථ්‍ය ලැබීමට සුදුසුකම් ලැබීමේ පරීක්ෂණයේදී පහත සඳහන් ලඝු ලේඛකයන් ඔවුන්ගේ නාම ඉදිරියෙන් සඳහන් කොට ඇති විෂයයෙන්/විෂයයන්හෙන් සමර්ථ වී ඇති බැව් මෙයින් දන්වමි :—

| නම | දෙපාර්තමේන්තුව | විෂයයන් |
|---|---|---|
| ලීලාවතී, ඩී. ජී. ඒ. (මෙනෙවිය) | කම්කරු, නිවාස හා සමාජ සේවා අමාත්‍යාංශය | රචනය |
| විජයදාස, පී. ටී. | රාජ්‍ය භාෂා කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව | රචනය සහ ලඝුලේඛනය |

2. පහත සඳහන් අපේක්ෂකයා සම්මේලන වාර්තා කිරීමේ පරීක්ෂණයට ඇතුළත් කර ගැනීමට සුදුසුකම් ලබා ඇත :—

| නම | දෙපාර්තමේන්තුව |
|---|---|
| විජයදාස, පී. ටී. | රාජ්‍ය භාෂා කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව |

එච්. ඊ. පීරිස්,
භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්.

1958 දෙසැම්බර් මස 30 වැනි දින,
කොළඹ මහා භාණ්ඩාගාරයේදී ය.

## 1957 සැප්තැම්බර් මාසයේදී පවත්වන ලද කොළඹ ප්‍රාචීන භාෂොපකාර සමාගමේ විභාග ප්‍රතිඵල ලෙඛනය

සංලක්ෂ්‍යය.—පහත පෙනෙන ලෙඛනයෙහි නම් අග යොද තිබෙන සි., පා., සං., දෙ., හි., ඉ., ග., යන් අකුරුවලින් ප්‍රකාශ වන්නේ පිළිවෙලින් සිංහල, පාලි, සංස්කෘත, දෙමළ, හින්දි, ඉංග්‍රීසි, සහ ගණිතය යන මේ කාණ්ඩ වලින් ඒ ඒ නම් ඇති අපෙක්ෂකයන් සමර්ථවී සිටින බවයි. සො. යන්නෙන් දක්වන්නේ සොවාත්සාහයෙන් යනුයි.

මේ ලෙඛනයෙහි නම් සඳහන් නොවන අපෙක්ෂකයෝ තම තමන් ගත් විභාග වලින් අසමර්ථ වී සිටිත්.

### අවසාන විභාගය

පසුගිය වර්ෂවල විභාගයට පෙනී සිට මෙවර විභාගය සම්පූර්ණකර අවසාන සහතිකය ලැබීමට හිමිව සිටින භවත්හු :—

| විභාග අංකය | පංතිය | නම | කලින් සමර්ථ වූ කාණ්ඩ | අධ්‍යයන කළ ස්ථානය |
|---|---|---|---|---|
| කේ.පී. 22 | 1 | අලුත්ගම ධම්මසිද්ධි (සං.) | සි., පා. | (සො.) විද්‍යාලංකාර පිරිවෙණ, කැළණිය |
| බී.පී. 18 | — | යටවත්තේ ධම්මක්ඛන්ධ (සං.) | සි., පා. | (සො.) ඥානොදය පිරිවෙණ, වටද්දර |
| බී.පී. 23 | — | ගල්වැම් වත්තේ පඤ්ඤාතිස්ස (සං.) | සි., පා. | සොවාත්සාහයෙන් |
| බී.පී. 25 | — | ගෝවුස්සේ සුමංගල (සං.) | සි., පා. | සොවාත්සාහයෙන් |
| සී. 342 | — | කුරුණෑගොඩ පියතිස්ස (සං.) | සි., පා. | විද්‍යොදය පිරිවෙණ, කොළඹ |
| සී. 345 | — | කරපුටුගල සුගතවංස (සං.) | සි., පා. | එම |
| සී. 390 | — | මහගිල්ලේ පඤ්ඤාවංස (පා., සං.) | සි. | ශ්‍රී ලංකා විද්‍යාලය, මරදන |
| සී. 391 | — | ගොඩවෙල පඤ්ඤාලොක (පා.) | සි., සං. | එම |
| සී. 393 | — | කරතොට සිද්ධත්ථ (පා., සං.) | සි. | එම |
| සී. 894 | — | තල්ගහගොඩ සිද්ධත්ථ (පා. සං.) | සි. | එම |
| සී. 553 | — | ලෙනගල ධම්මාරාම (පා. සං.) | සි. | විද්‍යාලංකාර පිරිවෙණ, කැළණිය |
| සී. 557 | — | උඩපොළ ජිනරතන (සං.) | සි., පා. | එම |
| සී. 570 | — | ගාල්ලේ පුඤ්ඤසිරි (සං.) | සි., පා. | එම |
| සී. 577 | — | කටියල සුමනසිරි (සං.) | සි., පා. | එම |
| සී. 583 | — | හිදව විමලජොති (සං.) | සි., පා. | එම |
| සී. 800 | — | බලදෙර චන්දසිරි (සං.) | සි., පා. | සරස්වතී පිරිවෙණ, බලගල්ල, දිවුලපිටිය |
| සී. 804 | — | අටබාගේ පඤ්ඤාසාගර (සං.) | සි., පා. | එම |
| සී.පී. 62 | — | ඒ. ජේම්ස් පෙරේරා (සං.) | සි., පා. | සොවාත්සාහයෙන් |
| සී.පී. 64 | — | නාහල්ලේ පුඤ්ඤානන්ද (සං.) | සි., පා. | සොවාත්සාහයෙන් |
| සී.පී. 67 | — | දරණගම සුගතපාල (සං.) | සි., පා., තර්ක | සොවාත්සාහයෙන් |
| සී.පී. 83 | — | පල්ලත්තර සුමනජෝති (සං.) | සි., පා. | (සො.) විද්‍යොදය පිරිවෙණ |
| සී.පී. 86 | — | පල්ලාවෙල සද්ධාතිස්ස (සං.) | සි., පා. | (සො.) විද්‍යොදය පිරිවෙණ |
| සී.පී. 121 | — | ඇම්කෙහෙල්ගල්ලේ සරණජොති (සං.) | සි., පා. | (සො.) විද්‍යාකර පිරිවෙණ, බෙම්මුල්ල |
| සී.පී. 122 | — | හීයවෙල සුගුණසාර (පා.) | සි., සං. | (සො.) විද්‍යොදය පිරිවෙණ, කොළඹ |
| සී.පී. 180 | — | අළුතැපොල ධම්මපාල (සං.) | සි., පා. | සොවාත්සාහයෙන් |
| සී.පී. 185 | — | කරගල විමලධම්ම (සං.) | සි., පා. | සොවාත්සාහයෙන් |
| ඩී. 92 | — | හුළංගමුවේ පෙමරතන (සං.) | සි., පා. | විද්‍යාශෙඛර පිරිවෙණ, කුඹියන්ගොඩ, මාතලේ |
| ඩී. 97 | — | තෙලහැර සුමන (සං.) | සි., පා. | ශාසනොදය පිරිවෙණ, අලපලාවෙල, හන්දෙස්ස |
| ඩී.102 | — | හිගුරක්දමන පඤ්ඤාසීහ (පා., සං.) | සි. | සංඝරාජ පිරිවෙණ, මහනුවර |
| ඩී.146 | — | කුඹල්ගමුවේ සොභිත (සං.) | සි., පා. | ඥානෝදය පිරිවෙණ, වටද්දර, ගම්පොළ |
| ඩී.පී. 39 | — | අංකොක්කාවල සුගුණපාල (පා.) | සි., සං. | (සො.) විද්‍යාලංකාර පිරිවෙණ |
| ඩී.පී.41 | — | යටිගල්පොත්තේ සරණංකර (සං.) | සි., පා. | සොවාත්සාහයෙන් |
| ජී.181 | — | නාරන්දෙනියේ පඤ්ඤාරතන (සං.) | සි., පා. | සිරිමංගල පිරිවෙණ, වල්පොල, මාතර |
| ජී.185 | — | බබරන්දේ මහානාම (පා.) | සි., සං. | මහාමන්තින්ද පිරිවෙණ, වැලිවේරිය, මාතර |
| ජී.188 | — | ගතාරේ ධම්මපාල (සං.) | සි., පා. | විද්‍යානිකෙත පිරිවෙණ, සපුගොඩ, කඹුරුපිටිය |
| ජී.පී. 42 | — | මීගොඩ කල්‍යාණතිස්ස (පා.) | සි., සං. | (සො.) විද්‍යාලංකාර පිරිවෙණ, කැළණිය |
| ජී.පී. 77 | — | පලපත පාලිත (සං.) | සි., පා. | සොවාත්සාහයෙන් |
| කේ. 101 | — | ඉකිරිවත්තේ මෙධංකර (පා., සං.) | සි. | මලියදෙව විද්‍යාරක්ෂක පිරිවෙණ, කුරුණෑගල |
| ආර්.පී. 29 | — | ඉඹුලමූරේ ධර්මමූර්ති (සං.) | සි., පා. | සොවාත්සාහයෙන් |

පහත නම් සඳහන් භවත්හු තම නම් ඉදිරියේ දක්වෙන කාණ්ඩවලින් පමණක් සමර්ථවී සිටිත් :—

| විභාග අංකය | නම | අධ්‍යයන කළ ස්ථානය |
|---|---|---|
| සී. 320 | කලුගල චන්දනන්ද (සිං) | විද්‍යොදය පිරිවෙණ, කොළඹ |
| සී. 323 | දලුපොතගම නන්දසාර (සි.) | එම |
| සී. 324 | හල්මිල්ලවැවේ පියරතන (සි.) | එම |
| සී. 325 | හුන්දිරාපොල රතනජොති (සි.) | එම |
| සී. 329 | වැලිතර සුධම්ම (සි.) | එම |
| සී. 336 | කොක්මාදුව ගුණසිරි (පා.) | එම |
| සී. 337 | හක්මන හෙමානන්ද (පා.) | එම |
| සී. 341 | පොල්වත්තේ පඤ්ඤානන්ද (සි.) | එම |
| සී. 352 | වරායායේ සුමනසාර (සං.) | විද්‍යාරත්න පිරිවෙණ, හොරන |
| සී. 356 | කට්ටමුරිච්චානේ සිරි භාරතී (සි.) | ශ්‍රී ධර්මෝදය පිරිවෙණ, වැල්ලවත්ත |
| සී. 357 | මාපළගම සොමිස්සර (සි.) | එම |
| සී. 358 | බෝපිටියේ වංසානන්ද (සි.) | එම |
| සී. 361 | මීරිස්වල අනුරුද්ධ (සි.) | ශ්‍රී ලංකා විද්‍යාලය, මරදන |
| සී. 362 | කුළුගම්මන දෙවමිත්ත (සං.) | එම |
| සී. 365 | වරදිවෙල දෙවරක්ඛිත (සං.) | එම |
| සී. 368 | කරතොට මහින්ද (සි.) | එම |
| සී. 372 | නාගොඩ නන්දපාල (සි.) | එම |
| සී. 375 | මැදගොඩවත්තේ පඤ්ඤාසාර (සි.) | එම |
| සී. 377 | ඇහැලියගොඩ සොරත (සි.) | එම |
| සී. 383 | වළකුඹුරුමුල්ලේ සුධර්ම (සං.) | එම |
| සී. 384 | කළුගමුවේ සිරිධම්ම (සං.) | එම |
| සී. 385 | කිරම විමලඤාණ (සි.) | එම |
| සී. 387 | මරදූරාවෙල විජයසිරි (සං.) | එම |
| සී. 388 | හීනාගම ධම්මානන්ද (සං.) | එම |
| සී. 397 | සිටිනාමලුවේ ධම්මජොති (සි.) | එම |

| විභාග අංකය | නම | අධ්‍යයන කළ ස්ථානය |
|---|---|---|
| සී. 543 | උඩුවාවල චන්දනන්ද (සි.) | විද්‍යාලංකාර පිරිවෙණ, කැළණිය |
| සී. 544 | තලගුණේ ධම්මරතන (සි.) | එම |
| සී. 545 | බදුල්ලේ ධම්මසේන (සි.) | එම |
| සී. 547 | කණුමුල්දෙණියේ ධම්මවිචය (සි.) | එම |
| සී. 550 | වරකාවේ ධම්මාලෝක (පා.) | එම |
| සී. 555 | ඌරුගල ගුණසිරි (සි.) | එම |
| සී. 559 | ගල්බොඩ නන්දාරාම (සි.) | එම |
| සී. 560 | වියාදිගුණේ නන්දසෝම (පා., සං.) | එම |
| සී. 562 | පරපාමුල්ලේ ඤාණාලෝක (සං.) | එම |
| සී. 564 | අඹන්පොළ පඤ්ඤාරතන (සි.) | එම |
| සී. 566 | නක්කාවිට පඤ්ඤාරාම (සං.) | එම |
| සී. 568 | තොටගමුවේ පඤ්ඤාසාර (සි.) | එම |
| සී. 569 | තලවින්නේ පුඤ්ඤරතන (සි.) | එම |
| සී. 571 | හාල්යාලේ රතනජෝති (සි.) | එම |
| සී. 573 | දෙඹවෙල සරණංකර (සි.) | එම |
| සී. 574 | කොස්ගොඩ සිරිසුධම්ම (සි.) | එම |
| සී. 578 | පෝප්පිටියේ සුමනතිස්ස (සි.) | එම |
| සී. 584 | විතාරන්දෙණියේ විමලසිරි (සි., සං.) | එම |
| සී. 586 | කිතගම විපුලතිස්ස (සි.) | එම |
| සී. 649 | මුඩගමුවේ චන්දකිත්ති (පා.) | විද්‍යාකර පිරිවෙණ, බණ්ඩාරබටවල, බෙම්මුල්ල |
| සී. 651 | බණ්ඩාරබටවල සුමණවංස (සං.) | එම |
| සී. 752 | නාඹටුන්නේ ඤාණධජ (පා.) | සිරි නන්දන පිරිවෙණ, සරික්කාමුල්ල, මොරටුව |
| සී. 758 | පරගල සුමනසාර (පා.) | විද්‍යාරාම පිරිවෙණ, මීගහකැන්න |
| සී. 761 | හැතැක්මේ විමලසාර (සි.) | සධර්මාකර පිරිවෙණ, පින්වත්ත, පානදුර |
| සී. 805 | දූනුපොත පාලිත (සි.) | සරසවතී පිරිවෙණ, බලගල්ල, දිවුලපිටිය |
| සී. 811 | මලවිට සෝමසිරි (සි.) | විද්‍යානන්ද පිරිවෙණ, නිට්ටඹුව |
| සී.පී. 37 | නාරන්දෙණියේ ධම්මරක්ඛිත (සි.) | (සව.) විද්‍යාලංකාර පිරිවෙණ |
| සී.පී. 38 | තුඹුල්ලේ ධම්මානන්ද (සි.) | (සව.) විද්‍යාතේජෝදය පිරිවෙණ |
| සී.පී. 50 | නිකගොඩ බෙමානන්ද (සි.) | (සව.) විද්‍යොදය පිරිවෙණ |
| සී.පී. 56 | අඹන්වැල්ලේ පඤ්ඤාසෙඛර (පා.) | (සව.) විද්‍යොදය පිරිවෙණ |
| සී.පී. 75 | මොන්නැකුලමේ සුමනතිස්ස (සි.) | ස්වෝත්සාහයෙන් |
| සී.පී. 113 | කඹුරුගොඩ ධම්මානන්ද (සි.) | ස්වෝත්සාහයෙන් |
| සී.පී. 119 | ඌරාපොල සුගතසිරි (සං.) | (සව.) විද්‍යොදය පිරිවෙණ |
| සී.පී. 150 | පස්සර පඤ්ඤාරාම (සි.) | (සව.) විද්‍යොදය පිරිවෙණ |
| සී.පී. 157 | මීගස්තැන්නේ සුමන (සි.) | ස්වෝත්සාහයෙන් |
| සී.පී. 173 | වැලිගම සීලානන්ද (සි., පා.) | (සව.) විද්‍යොදය පිරිවෙණ |
| ඩී. 90 | කොටවැල්ලේ ගුණරතන (සි.) | ශාසනාලංකාර පිරිවෙණ, හැරමිටිගල, පිළිමතලාව |
| ඩී. 93 | පැලව ගුණානන්ද (සි.) | ශ්‍රී සිද්ධාතේජෝදය පිරිවෙන, මැදගොඩ, ගලගෙදර |
| ඩී. 94 | යටිපියන්ගල ධම්මානන්ද (සි.) | ශාසනොදය පිරිවෙණ, අලපලාවල, හන්දෙස්ස |
| ඩී. 95 | කොත්මලේ ධම්මාලෝක (සි.) | එම |
| ඩී. 96 | අගාරේගෙදර ජිනානන්ද (සි.) | එම |
| ඩී. 100 | හක්මන විමලසාර (සි.) | ශ්‍රී සිද්ධාර්ථ පිරිවෙණ, රත්තේපිටිය, මැණික්දිවෙල |
| ඩී.පී. 32 | ගලහ පඤ්ඤාසාර (සි.) | ස්වෝත්සාහයෙන් |
| ඩී.පී. 33 | ගලගෙදර පඤ්ඤාසාර (සි.) | (සව.) විද්‍යාලංකාර පිරිවෙණ |
| ඩී.පී. 44 | විශ්වනාත් වජිරසේන (පා.) | ස්වෝත්සාහයෙන් |
| ඩී.පී. 62 | හාරිස්පත්තුවේ විපස්සී (පා.) | (සව.) ශ්‍රී ලංකා විද්‍යාලය, මරදන |
| ජී. 31 | වැලිපටන්විල විජිතවංශ (සි.) | ශාස්ත්‍රොදය පිරිවෙණ, අම්බලන්ගොඩ |
| ජී. 86 | වත්තෙහේනේ පඤ්ඤාරතන (සි., පා.) | ආනන්ද පිරිවෙණ, කිතුලම්පිටිය, ගාල්ල |
| ජී. 182 | තලල්ලේ කාමරස (පා.) | සිරිමංගල පිරිවෙණ, වල්පොල, මාතර |
| ජී. 187 | හේ. සිරිසේන (සි.) | විද්‍යාතුංග පිරිවෙණ, වැවුරුකන්නල, දික්වැල්ල |
| ජී.පී. 14 | නාකන්දේ හේමසිරි (සි.) | (සව.) සුධර්මාකර පිරිවෙණ |
| ජී.පී. 16 | ගොම්බද්දල නන්දාරාම (සං.) | ස්වෝත්සාහයෙන් |
| ජී.පී. 17 | කුළුගම්මන නන්දසාර (සං.) | ස්වෝත්සාහයෙන් |
| ජී.පී. 21 | කන්දේගෙදර ශෝභිත (සං.) | ස්වෝත්සාහයෙන් |
| ජී.පී. 48 | වැයිහේනේ සුමන (සි.) | (සව.) විද්‍යොදය පිරිවෙණ, කොළඹ |
| ජී.පී. 81 | කුරුඳුවත්තේ සමානන්ද (සි.) | ස්වෝත්සාහයෙන් |
| කේ. 102 | කඩහපොළ පෙමානන්ද (සි.) | මලියදෙව විද්‍යාරක්ෂක පිරිවෙණ, කුරුණෑගල |
| කේ. 103 | අලුත්ගම සංඝරක්ඛිත (සි.) | එම |
| කේ. 104 | තල්ගස්වැවේ විමලසාර (සි.) | එම |
| කේ. 108 | කෝවානේ සුමන (සි.) | රත්නොදය පිරිවෙණ, මැද්දේගම, වැල්ලව |
| කේ. පී. 24 | මැද්දේගම චන්දජෝති (පා.) | (සව.) රත්නොදය පිරිවෙණ |
| කේ.පී. 26 | ලිකොළපිටියේ ධම්මරක්ඛිත (සි.) | (සව.) විද්‍යාලංකාර පිරිවෙණ, කැළණිය |
| කේ.පී. 34 | වැලිවෙහෙර ඤාණින්ද (සං.) | (සව.) ශ්‍රී ලංකා විද්‍යාලය, මරදන |
| ආර්. පී. 10 | ඒ. බී. ගම්මුදලි (සි.) | ස්වෝත්සාහයෙන් |

### ත්‍යාග හිමි භවත්හු

**අවසාන විභාගය —**

1. සිංහල, පාලි, සංස්කෘත යන භාෂාත්‍රයෙන් ගෞරව සහිතව කිසිම ශිෂ්‍යයෙකු සමර්ථ වී නැති බැවින් මෙවර උභයසේකර ස්වර්ණ මුද්‍රිකාව ප්‍රදානය කරනු නොලැබේ.

2. ලංකා ඉතිහාසය, පුරාවිද්‍යා ශිලාලේඛන යන කරුණුවලින් ඉතා උසස් ලෙස සමර්ථවන ශිෂ්‍යයාට හිමි ස්ටබ්ස් ත්‍යාගය අංක සී.පී. 86 දරණ පල්ලාවල සද්ධාතිස්ස ශිෂ්‍යයාට ප්‍රදානය කරනු ලැබේ.

3. සිංහල, පාලි, සංස්කෘත යන භාෂාත්‍රයෙන් පළමුවැනියාට නියම වෛද්‍යශේඛර ත්‍යාගය අංක කේ. පී. 22 දරණ අලුත්ගම ධම්මසිද්ධි ශිෂ්‍යයාට ප්‍රදානය කරනු ලැබේ.

4. පාලි කොටසින් පළමුවැනියාට නියම රාජගුරු ශ්‍රී සුභූති ත්‍යාගය අංක කේ. පී. 22 දරණ අලුත්ගම ධම්මසිද්ධි ශිෂ්‍යයාට ප්‍රදානය කරනු ලැබේ.

5. තර්කන්‍යාය කොටසින් ඉතා උසස් ලෙස සමර්ථවන ශිෂ්‍යයාට නියම මාපා ගුණරත්න ත්‍යාගය අංක බී. පී. 18 දරන යටවත්තේ ධම්මක්ඛන්ධ ශිෂ්‍යයාට ප්‍රදානය කරනු ලැබේ.

6. සිංහල කොටසින් ඉතා උසස් ලෙස සමර්ථවන ශිෂ්‍යයාට නියම අභයවික්‍රම ත්‍යාගය අංක සී. පී. 86 දරන පල්ලාවල සද්ධාතිස්ස ශිෂ්‍යයාට ප්‍රදානය කරනු ලැබේ.

7. විනය ග්‍රන්ථයකින් ප්‍රමුඛයාවන ශිෂ්‍යයාට නියම ඕදිරිස්හාමි ත්‍යාගය එක සමාන ලකුණු ලබා ඇති අංක සී. 391 දරණ ගොඩවෙල පඤ්ඤාලෝක සහ අංක සී. 553 දරණ ලෙනගල ධම්මාරාම යන ශිෂ්‍යයන්ට ප්‍රදානය කරනු ලැබේ.

### මධ්‍යම විභාගය

සම්පූර්ණ සාමාර්ථ්‍යය ලැබූ භවතුන්ගේ නම් පහත දක්වේ. අතිරේක කාණ්ඩවලින් ද සමර්ථ වූ භවතුන්ගේ නම්වලට අගින් එසේ සමර්ථ වූ අතිරේක කාණ්ඩද දක්වා ඇත :—

| විභාග අංකය | පංතිය | නම | අධ්‍යයන කළ ස්ථානය |
|---|---|---|---|
| බී. 18 | — | බැද්දේගම රතනසාර | සුධර්මාවාස පිරිවෙණ, හාලිඇල |
| සී. 216 | — | කොටිගල ධම්මරතන | විද්‍යොදය පිරිවෙණ, කොළඹ 10 |
| සී. 219 | — | ගලඋඩ ඤාණවිමල | එම |
| සී. 224 | — | තලාවේ නන්දරාම | එම |
| සී. 225 | — | බිබිලිගමුවේ පඤ්ඤාලොක | එම |
| සී. 228 | — | බෝදිමුල්ලේ පඤ්ඤාසාර | එම |
| සී. 257 | — | වැලිතර පඤ්ඤාජොති | එම |
| සී. 260 | — | නෙරළුවේ සුමංගල | එම |
| සී. 265 | — | අටබාගේ ආනන්ද සිරි ඤාණිස්සර | ශ්‍රී ලංකා විද්‍යාලය, මරදාන |
| සී. 284 | — | ගම්පහ පඤ්ඤාසේකර | එම |
| සී. 285 | — | හුනුවල පඤ්ඤාසේකර | එම |
| සී. 292 | — | පුවක්පිටියේ සෝමානන්ද | එම |
| සී. 300 | — | නාගහපොල විජිත | එම |
| සී. 490 | — | ගැටමාන්නේ චන්දලොක | විද්‍යාලංකාර පිරිවෙණ, කැළණිය |
| සී. 493 | — | කොස්වත්තේ ධම්මජොති | එම |
| සී. 504 | — | හල්වතුරේ මහින්ද | එම |
| සී. 505 | — | ඉනාමළුවේ මංගල | එම |
| සී. 528 | — | උඩදිවුල්වැවේ සොරත | එම |
| සී. 534 | — | කල්ලන්චියේ විමල්සාර | එම |
| සී. 535 | — | වැලිගෙපොළ විමලසාර | එම |
| සී. 539 | — | අපරක්කේ යසස්සි | එම |
| සී. 734 | — | උඩවෙල බුද්ධරක්ඛිත | ප්‍රවචනොදය පිරිවෙණ, මොල්ලිගොඩ, වාද්දුව |
| සී. 738 | — | අඹලියද්දේ අරියඤාණ (හි.) | ශ්‍රී ධර්මපාල පිරිවෙණ, බෙල්ලන |
| ඩී.පී. 51 | — | කහටපිටියේ ධම්මාරාම | (ස්ව.) විද්‍යොදය පිරිවෙණ, කොළඹ |
| ජී. 163 | — | හේ. වී. ධර්මසෝම | විද්‍යාතුංග පිරිවෙණ, වැවුරුකන්නල, දික්වැල්ල |
| කේ. 90 | — | අල්ගම සරණතිස්ස | මලියදෙව විද්‍යාරක්ෂක පිරිවෙණ, කුරුණෑගල |
| කේ. 97 | — | නවසිගහවත්තේ උපාලි | ධර්මරාජ පිරිවෙණ, නැදලගමුව, වඩුමුන්නේගෙදර |

1955, 1956 වර්ෂවලදී ඌන සාමර්ථ්‍යය ලබා මේවර විභාගය සම්පූර්ණ කළ භවත්හු.

| විභාග අංකය | පංතිය | නම | අධ්‍යයන කළ ස්ථානය |
|---|---|---|---|
| සී.පී. 12 | — | වැලිඋල්ලේ සොභිත | ස්වොත්සාහයෙන් |
| සී. 207 | — | රත්මලේ ආනන්ද | විද්‍යොදය පිරිවෙණ, කොළඹ |
| සී. 214 | — | මාකඳුරේ ධම්මරක්ඛිත | එම |
| සී. 246 | — | බැරගම සොභිත | එම |
| සී. 640 | — | අලව්වේ සිරිධම්ම | ශ්‍රී සුමංගල විද්‍යාලය, වළලියද්ද, එල්ලක්කල |
| සී. 248 | — | වැලිපැන්නේ සොමාලොක | විද්‍යොදය පිරිවෙණ, කොළඹ 10 |
| සී. 251 | — | වැල්හේනේ සුජාත | එම |
| සී. 792 | — | නුගදෙනියේ අමරවංස | සරසවතී පිරිවෙණ, බලගල්ල, දිවුලපිටිය |
| ඩී. 82 | — | මඩම්පැල්ල සිරිසුධම්ම | ශාසනොදය පිරිවෙණ, අලපලාවල, හන්දෙස්ස |
| ආර්. 32 | — | තෙප්පනාවේ අනුරුද්ධ | ශ්‍රී සුමන විද්‍යාලය, රත්නපුරය |

### ඌන සාමර්ථ්‍යය ලත් භවත්හු

ඒ ඒ අයදුම්කරුවන් නමට අගින් වරහන් තුළ යොදා ඇති අකුරුවලින් ඌන සාමර්ථ්‍යය ලත් විෂයය දැක්වේ :—

| විභාග අංකය | නම | අධ්‍යයන කළ ස්ථානය |
|---|---|---|
| සී. 299 | වාද්දුවේ විජිතනන්ද (සං.) | ශ්‍රී ලංකා විද්‍යාලය, මරදාන |
| සී. 638 | උඩුවක පියරතන (සං.) | ශ්‍රී සුමංගල විද්‍යාලය, වළලියද්ද, එල්ලක්කල |
| ඩී. 142 | තිනියගල ගුණානන්ද (සං) | ගංගා ශ්‍රී පිරිවෙණ, නියංගම්පාය, ගම්පොළ |

### ත්‍යාග හිමි භවත්හු

මධ්‍යම විභාගය —

8. සිංහල කොටසින් ප්‍රමුඛයාව සමර්ථවන ශිෂ්‍යාට නියම බී. ජයසේකර ත්‍යාගය අංක සී. 535 දරණ වැලිගෙපොල විමලසාර ශිෂ්‍යාට ප්‍රදානය කරනු ලැබේ.

9. පාලි කොටසින් ප්‍රමුඛයාව සමර්ථවන ශිෂ්‍යයාට නියම ඤාණතිලක ත්‍යාගය අංක කේ. 97 දරණ නවසිගහවත්තේ උපාලි ශිෂ්‍යයාට ප්‍රදානය කරනු ලැබේ.

10. සිංහල, පාලි, සංස්කෘත යන කොටස්වලින් ප්‍රමුඛයාව සමර්ථවන ශිෂ්‍යයාට නියම ශ්‍රී ප්‍රඥානන්ද ත්‍යාගය අංක සී. 535 දරණ වැලිගෙපොල විමලසාර ශිෂ්‍යයාට ප්‍රදානය කරනු ලැබේ.

14. විභාගත්‍රයෙන් කවර විභාගයකදී නමුත් විනය ග්‍රන්ථයකින් වැඩි ලකුණු ලබන ශිෂ්‍යයාට නියම ශ්‍රී ඥාණවිමල ත්‍යාගය අංක ජී. 163 දරණ හේ. වී. ධර්මසෝම ශිෂ්‍යයාට ප්‍රදානය කරනු ලැබේ.

### ප්‍රාරම්භ විභාගය

භාෂා හතරකින් සමර්ථවූ භවත්හු :—

| විභාග අංකය | සංතිය | නම | අධ්‍යයන කළ ස්ථානය |
|---|---|---|---|
| සී. 694 | 1 | දෙදියවල හෙමසිරි (සි., පා., සං., හි.) | ශ්‍රී ධර්මපාල පිරිවෙණ, බෙල්ලන |
| සී. 693 | — | කුඹුරුගමුවේ ධම්මවංස (සි., පා., සං., හි.) | එම |
| සී. 695 | — | ලූල්බද්දුව ඤාණිස්සර (සි., පා., සං., හි.) | එම |

සිංහල, පාලි, සංස්කෘත යන භාෂා තුනෙන් සමර්ථවූ භවත්හු :—

| විභාග අංකය | පංතිය | නම | අධ්‍යයන කළ ස්ථානය |
|---|---|---|---|
| ජී. 59 | ගෞරව | බුලත්කොහුපිටියේ ඤාණාලංකාර | විද්‍යාලොක පිරිවෙණ, ගාල්ල |
| සී. 47 | 1 | අඹේවෙල මංගල | විද්‍යොදය පිරිවෙණ, කොළඹ |
| සී. 51 | 1 | එල්ලාවල මෙධානන්ද | එම |
| සී. 83 | 1 | කිරම සාසනසිරි | එම |
| සී. 88 | 1 | තිනියාවල සිද්ධත්ථ | එම |
| සී. 163 | 1 | කහදෙනිගම ජිනරතන | ශ්‍රී ලංකා විද්‍යාලය, මරදන |
| සී. 415 | 1 | මල්ලැහැවේ ගුණානන්ද | විද්‍යාලංකාර පිරිවෙණ, කැළණිය |
| සී. 602 | 1 | දූවේගොඩ සොරත | ශ්‍රී සුමංගල විද්‍යාලය, වළලියද්ද, එල්ලක්කල |
| සී. 765 | 1 | තෙලහැර ඤාණරතන | විද්‍යානන්ද පිරිවෙණ, නිට්ටඹුව |
| ඩී. 11 | 1 | අමුපිටියේ ධම්මරතන | ශාස්ත්‍රාලංකාර පිරිවෙණ, හැරම්ටිගල, පිළිමතලාව |
| ඩී. 26 | 1 | වරාගොඩ පේමරතන | ශ්‍රී සුදර්ශන විද්‍යාලය, කයිකාවල, මාහලේ |
| ජී. 7 | 1 | අම්බලන්ගොඩ කවිධජ | ශාස්ත්‍රොදය පිරිවෙණ, අම්බලන්ගොඩ |
| ජී. 88 | 1 | තංගල්ලේ වජිරකිත්ති | සිරි සුනන්ද ත්‍රිපිටක විද්‍යාලය, මිරිස්ස |
| ජී. 134 | 1 | කඹුරුපිටියේ පෙමවංස | සිරිමංගල පිරිවෙණ, වල්පොල, මාතර |
| බී. 15 | — | පේරවැල්ලේ නන්දරතන | විද්‍යා භූෂණ පිරිවෙණ, ඇටම්පිටිය |
| බී. 16 | — | උඩුහාවර සුමනානන්ද | එම |
| බී.සී. 2 | — | බොල්ගල්ලේ ධම්මරතන | (ස්ව.) සද්ධර්මාලංකාර පිරිවෙණ, දියතලාව |
| සී. 4 | — | පොල්ගම්පල අනුරුද්ධ | විද්‍යොදය පිරිවෙණ, කොළඹ |
| සී. 14 | — | කුඩගල්ආරේ ධම්මදස්සී | එම |
| සී. 39 | — | හැලව ජනානන්ද | එම |
| සී. 41 | — | හුණුවිල ජිනරතන | එම |
| සී. 58 | — | වැකුඹුරේ පඤ්ඤානන්ද | එම |
| සී. 64 | — | පලුතුඩුවේ පෙමාරාම | එම |
| සී. 71 | — | වරාහේනේ පියසිරි | එම |
| සී. 77 | — | නෙත්තිපොල සද්ධාරාම | එම |
| සී. 79 | — | කවුඩුවාවේ සංඝරතන | එම |
| සී. 96 | — | දෙල්වල සොරත | එම |
| සී. 114 | — | තලල්ලේ වජිරඤාන | එම |
| සී. 124 | — | පොල්පිටිමූකලානේ විමලවංස | එම |
| සී. 128 | — | කෙහෙල්පන්නල මුනින්දවංස | එම |
| සී. 135 | — | රඹාවැවේ ඤාණානන්ද | සුභද්‍රාරාම පිරිවෙණ, ගංගොඩවිල, නුගේගොඩ |
| සී. 136 | — | යටියන්තොට උපාලි | එම |
| සී. 138 | — | ලද්දුවේ චන්දිම | ශ්‍රී ධර්මොදය පිරිවෙණ, වැල්ලවත්ත |
| සී. 152 | — | කිරම අරියඤාණ | ශ්‍රී ලංකා විද්‍යාලය, මරදන, කොළඹ |
| සී. 154 | — | ගලගම ආනන්ද | එම |
| සී. 167 | — | මීරිගම මෙධානන්ද | එම |
| සී. 170 | — | ලේනම ඤාණින්ද | එම |
| සී. 179 | — | පෝහද්දරමුල්ලේ ප්‍රඥාමූර්ති | එම |
| සී. 180 | — | කාරියමඩිත්තේ රාහුල | එම |
| සී. 191 | — | යක්තල්ගොඩ සුගතවංස | එම |
| සී. 196 | — | නාගොල්ලාගොඩ උපාලි | එම |
| සී. 202 | — | අලවතුවල සොමරතන | එම |
| සී. 203 | — | ඇම්. ජී. චන්ද්‍රපාල | එම |
| සී. 402 | — | අතුරලියේ භද්දිය | විද්‍යාලංකාර පිරිවෙණ, කැළණිය |
| සී. 420 | — | වැලිකැටියේ මංගල | එම |
| සී. 434 | — | ඔරුතොට පඤ්ඤාරාම | එම |
| සී. 438 | — | ඇඹුල්අඹේ පියදස්සී | එම |
| සී. 441 | — | කුරුණෑගල පියරතන | එම |
| සී. 455 | — | පැල්පොළ සිරිසුමන | එම |
| සී. 460 | — | කාංජනම්කුලමේ සොමානන්ද | එම |
| සී. 466 | — | ලුනුගම සොමාවංස | එම |
| සී. 467 | — | බෝවල්ගහ සෝරත | එම |
| සී. 479 | — | කැකලපනේ විමලරතන | එම |
| සී. 596 | — | අනුරාධපුරේ දයානන්ද | ශ්‍රී සුමංගල විද්‍යාලය, වළලියද්ද, එල්ලක්කල |
| සී. 600 | — | කරඩුපනේ පෙමසිරි | එම |
| සී. 611 | — | දඹදෙණියේ දයානන්ද | එම |
| සී. 613 | — | කොහොඹේපොල ධම්මසිරි | විද්‍යාරවින්ද පිරිවෙණ, පහළගම, ගම්පහ |
| සී. 617 | — | කුකුල්කඩුවේ ඤාණසාර | එම |
| සී. 655 | — | යටවර විනයවංස | ග්‍රන්ථාකර පිරිවෙන, තෙබුවන |
| සී. 666 | — | කිරම විජිතනාන්ද | ශ්‍රී විජය සෞගත විද්‍යාලය, වලාන, පානදුරේ |
| සී. 667 | — | මීපනාවේ දයානන්ද | සද්ධර්මාකර පිරිවෙණ, පිංවත්ත, පානදුර |
| සී. 674 | — | මොරහැල නන්ද | එම |
| සී. 687 | — | ඉහලහෙවෙස්සේ සොමානන්ද | විද්‍යාරාම පිරිවෙණ, මීගහතැන්න |
| සී. 709 | — | සියඹලාවේ උපතිස්ස | විද්‍යාරාජ උපරිම පිරිවෙන, ගොරකාපොළ, පානදුර |
| සී. 713 | — | තලකිරියාවේ ඉන්දරතන | විද්‍යාසාර පිරිවෙණ, ජාවත්ත, කළුතර උතුර |
| සී. 720 | — | මහකුඹුරේ ධම්මිස්සර | ශ්‍රීනිවාස විද්‍යාලය, වලගෙදර |
| සී. 723 | — | කලෝටුවාවේ ගුණානන්ද | ප්‍රවචනොදය පිරිවෙණ, මොල්ලිගොඩ, වාද්දුව |
| සී. 724 | — | කනවැරැල්ලේ ජිනරතන | එම |
| සී. 731 | — | පෙතිගමුවේ සොමසිරි | එම |
| සී. 776 | — | තාඹුගල සොමවංස | ශාසනවර්ධන පිරිවෙණ, මීරිගම |
| සී. 778 | — | ආර්. එවෙදාරත්න | ශ්‍රී විද්‍යාසාගර පිරිවෙණ, ගනේගොඩ, පල්ලේවෙල |
| සී. 780 | — | හුණුපොළගෙදර අරියධම්ම | සරසවති පිරිවෙන, බලගල්ල, දිවුලපිටිය |
| සී.සී. 8 | — | ඩී. ජේ. කුමාරගේ | ස්වොත්සාහයෙන් |
| සී.සී. 10 | — | අකුරුගොඩ පෙමරතන | ස්වොත්සාහයෙන් |
| සී.සී. 100 | — | බලබෝවේ විමලකිත්ති | ස්වොත්සාහයෙන් |
| සී.සී. 132 | — | උඩගම උපරතන | (ස්ව.) විද්‍යාලංකාර පිරිවෙණ, කැළණිය |

| විභාග අංකය | පංතිය | නම | අධ්‍යයන කළ ස්ථානය |
|---|---|---|---|
| ඩී. 4 | — | අඹකුඹුරේ අස්සජී | ශ්‍රී සාරානන්ද විද්‍යාලය, ඊරියගම, පේරාදෙණිය |
| ඩී. 6 | — | පොල්ගහවෙල ධම්මපාල | එම |
| ඩී. 15 | — | කොටබෝගොඩ රතනසාර | ශාස්ත්‍රාලංකාර පිරිවෙණ, හැරමිටිගල, පිළිමතලාව |
| ඩී. 23 | — | අල්කේගම ධම්මාලෝක | ශ්‍රී ධර්මදීප පිරිවෙණ, වත්තේගම |
| ඩී. 24 | — | අලුත්ගම ඥාණරතන | ශ්‍රී සුදර්ශන විද්‍යාලය, කයිකාවල, මාතලේ |
| ඩී. 28 | — | අස්ගිරියේ රාහුල | එම |
| ඩී. 34 | — | වෙලන්ගහවත්තේ වංගීස | එම |
| ඩී. 37 | — | මාතලේ ඥාණින්ද | ශාසනෝදය පිරිවෙණ, අලපලාවල, හන්දෙස්ස |
| ඩී. 41 | — | ගම්පළ රාහුල | එම |
| ඩී. 43 | — | නින්දපැල්ලේ ගුණරතන | විද්‍යාදර්ශන පිරිවෙණ, වත්තේගම |
| ඩී. 46 | — | සියඹලාගොඩ මහානාම | සිරිනිවාස පිරිවෙණ, කඩුගන්නාව |
| ඩී. 108 | — | නාවෙල චන්දනන්ද | ඥානෝදය පිරිවෙණ, වටද්දර, ගම්පළ |
| ඩී. 109 | — | කඩදෙර ගුණානන්ද | එම |
| ඩී. 110 | — | දෙමැදබැද්දේ ඥාණතිලක | එම |
| ඩී. 118 | — | කොලුගල ආනන්ද | නිග්‍රොධබෙත්ත පිරිවෙණ, නෙළුඹුගල, හන්දෙස්ස |
| ඩී. 122 | — | හුරිකඩුවේ නාරද | එම |
| ඩී. 131 | — | රාවණාගොඩ ඥාණාලෝක | සිරිබුවනෙකබා පිරිවෙණ, ගම්පළ |
| ඩී. 132 | — | ගන්නෑවේ රතනපාල | එම |
| ඩී.පී. 16 | — | තෙලහැර විජයසිරි | (ඍව.) ශාසනෝදය පිරිවෙණ |
| ජී. 3 | — | අලුත්වල සමිතරතන | ජනනන්දරාම පිරිවෙණ, හික්කඩුව |
| ජී. 4 | — | හික්කඩුවේ සෝමසාර | එම |
| ජී. 10 | — | ලියන්ගස්වගුරේ සොරත | ශාසනෝදය පිරිවෙණ, අම්බලන්ගොඩ |
| ජී. 11 | — | මනිමෙල්වඩු දයාරත්න | එම |
| ජී. 49 | — | ලියන්වෙල ධම්මින්ද | රාජගිරි පිරිවෙණ, දෙඩන්දූව |
| ජී. 53 | — | මින්නේරියේ සුගුණකිත්ති | එම |
| ජී. 60 | — | ඕවිටිගමුවේ සද්ධානන්ද | විද්‍යාලොක පිරිවෙණ,ගාල්ල |
| ජී. 61 | — | වටරැක සොමාලොක | එම |
| ජී. 62 | — | ගෝනාපීනුවල සුමන | එම |
| ජී. 64 | — | මුල්ලෙවත්තේ වජිරඥාණ | එම |
| ජී. 71 | — | යටිගල මංගල | ශ්‍රී රෙවත කුඹල්වැල්ල, ගාල්ල |
| ජී. 76 | — | ජී. ජී. සී. සිරිවර්ධන | විද්‍යාචන්ද්‍ර පිවෙණ, දිගරුද්ද, අහංගම |
| ජී. 99 | — | කනංකේ විමලඥාණ | ජේතවන පිරිවෙණ, ගොඩපිටිය, අකුරැස්ස |
| ජී. 102 | — | ලබුහේන්ගොඩ චන්දරතන | සිරි රතනජොති පිරිවෙණ, ඌරාපොල, තිහගොඩ |
| ජී. 110 | — | තවාලුවිල උපාලි | ජයමහ විහාර පිරිවෙණ, කිතුලේවළ, මාතර |
| ජී. 118 | — | නාරද්දෙ මහානාම | ශ්‍රී සුදර්ශී පිරිවෙණ, මාතර |
| ජී. 120 | — | මාවරලෙ ඥාණාලොක | එම |
| ජී. 121 | — | යටිගල පඤ්ඤනන්ද | එම |
| ජී. 135 | — | අපරැක්කේ උදිත | සිරිමංගල පිරිවෙණ, විල්පොල, මාතර |
| ජී. 136 | — | පාතේගම උදිත | එම |
| ජී. 149 | — | මොදරවානේ සිද්ධත්ථ | මහාමන්තින්ද පිරිවෙණ, වැලිවේරිය, මාතර |
| ජී. 151 | — | එස්. අබේවර්ධන | විද්‍යාතුංග පිරිවෙණ, වැවිරුකන්නල, දික්වැල්ල |
| ජී 153 | — | දික්වැල්ලේ රේවත | එම |
| ජී. 156 | — | ගල්වැවේ පියනන්ද | ජිනරාජ පිරිවෙණ, පොත්තේවෙල ,හක්මන |
| ජී. 157 | — | හක්මන සුමංගල | එම |
| ජී. 159 | — | කිරිවැල්දෙණියේ උපනන්ද | විද්‍යානිකේත පිරිවෙණ, සපුගොඩ, කඹුරුපිටිය |
| ජී.පී. 55 | — | මුලටියන විමලඥාණ | (ඍව.) සිරිමංගල පිරිවෙණ |
| කේ. 1 | — | දමුණුපොල ධීරානන්ද | ශ්‍රී විද්‍යාතිලක පිරිවෙණ, වෑකන්ද, වැළඩ |
| කේ. 6 | — | දුනුකේබැද්දේ ඥාණරතන | එම |
| කේ. 7 | — | පුස්සැල්ලේ පවරකිත්ති | එම |
| කේ. 23 | — | තැලිහුන්නේ මුනින්දවංස | මලියදෙව විද්‍යාරක්ෂක පිරිවෙණ, කුරුණෑගල |
| කේ. 28 | — | දිවුලැකැලේ සංඝරතන | එම |
| කේ. 30 | — | මකුරුප්පේ සොමානන්ද | එම |
| කේ. 33 | — | මැදගම සුමනසාර | එම |
| කේ. 34 | — | දූනකදෙණියේ විමලජොති | එම |
| කේ. 36 | — | ඇටඹගස්කඩ රතනසාර | බෝධිගුප්ත පිරිවෙණ, දෙණගමුව, පොල්ගහවෙල |
| කේ. 44 | — | පාලුකඩවල සුමනරතන | රතනසෙල පිරිවෙණ, රත්මලේ, උහුමිය |
| කේ. 50 | — | රඹුක්වැල්ල පඤ්ඤසාර | ශාස්ත්‍ර රවින්ද පිරිවෙණ, පොල්ගොල්ල, ගොකරැල්ල |
| කේ. 57 | — | දුනුකේවත්තේ ගුණරතන | චන්දසෙල පිරිවෙණ, පොතුහැර |
| කේ. 67 | — | වත්තේගෙදර ධම්මොදය | රත්නෝදය පිරිවෙණ, මැද්දේගම, වැල්ලව |
| කේ. 70 | — | මහකන්දේගම සාසනවංස | එම |
| කේ.පී. 1 | — | ඒ. අබයකෝන් | ස්වෝත්සාහයෙන් |
| ආර්. 1 | — | ආසිදෙණියේ සොමරතන | විද්‍යාවංශ පිරිවෙණ, අලවතුර, බුලත්කොහුපිටිය |
| ආර්. 4 | — | ඇම්. ඥාණවිලාස | විද්‍යානිවාස පිරිවෙණ, ඇකිරියගල, හෙට්ටිමුල්ල |
| ආර්. 5 | — | පී. සුමෙධවංස | එම |
| ආර්. 12 | — | ඉමදූව පියතිස්ස | ශ්‍රී සුමන විද්‍යාලය, රත්නපුර |
| ආර්. 19 | — | තම්මිට සොරත | එම |
| ආර්. 20 | — | දෙඹවල විජයඥාණ | එම |
| ආර්. 21 | — | හල්දෙල විමලකිත්ති | එම |
| ආර්. 22 | — | කුඩාවේ පඤ්ඤවංස | ශ්‍රී ඥාණොභාස විද්‍යාලය, මල්වල හන්දිය, රත්නපුර |
| ආර්. 25 | — | වැවුම්මල විමලජොති | එම |
| ආර්. 27 | — | මඩලගම නාගිත | ශ්‍රී සුදර්මොදය පිරිවෙණ, පැල්මඩුල්ල |
| ආර්. 31 | — | ඩී. ජී. සෝමසිරි | එම |

මීට පෙර ප්‍රාරම්භ විභාගය සම්පූර්ණ කර මේ වර අතිරේක භාෂාවලින් සමත් වූ භවත්නු :—

| | | |
|---|---|---|
| ඕ. 81 | ලෙවන්ගම සරණංකර (දෙ.) | විද්‍යොදය පිරිවෙණ, කොළඹ |

තෲාග හිමි භවත්හු

ප්‍රාරම්භ විභාගය—

11. සිංහල, පාලි, සංස්කෘත යන භාෂාත්‍රයෙන් ප්‍රමුඛයාව සමර්ථවන ශිෂ්‍යයාට නියම අමරසූරිය ත්‍යාගය අංක ජී. 59 දරණ බුලත්කොහුපිටියේ ඥාණාලංකාර ශිෂ්‍යයාට ප්‍රදානය කරනු ලැබේ.

12. පාලි කොටසින් ප්‍රමුඛයාව සමර්ථවන ශිෂ්‍යයාට නියම කරුණාතිලක ත්‍යාගය අංක සී. 765 දරණ තෙලහැර ඥාණරතන ශිෂ්‍යයාට ප්‍රදානය කරනු ලැබේ.

13. සංස්කෘත කොටසින් ප්‍රමුඛයාව සමර්ථවන ශිෂ්‍යයාට නියම පියරතන ත්‍යාගය අංක ජී. 59 දරණ බුලත්කොහුපිටියේ ඥාණාලංකාර ශිෂ්‍යයාට ප්‍රදානය කරනු ලැබේ.

1958 මාර්තු 19 වැනි දින,
විභාග කාර්‍යාලය, කොළඹ 2.

එල්. එල්. කේ. ගුණතුංග.
විභාග කොමසාරිස්.

---

භාණ්ඩාගාරයේ අංකය : 1/83/4 (ජී)

## ස්ථාන මාරුව සහිත ලඝු ලේඛක සේවයේ පහළ පංතියට අයත් ලඝු ලේඛකයන්ගේ පත්වීම් ස්ථිර කිරීමේ සිංහල විභාගය—ඔක්තෝබර්, 1958

1958 ඔක්තෝබර් මස 18 වැනි දින පවත්වනු ලැබූ ස්ථාන මාරුව සහිත ලඝු ලේඛක සේවයේ පහළ පංතියට අයත් ලඝු ලේඛකයන්ගේ පත්වීම් ස්ථිර කිරීම සඳහා සුදුසුකම් ලැබීමේ පරීක්ෂණයේදී පහත සඳහන් අස්ථිර සහ පරීක්ෂණ කාල සීමාවනට යටත්ව පත්වීම් ලබා ඇති ලඝු ලේඛක, ලඝු ලේඛිකාවන් ඔවුන්ගේ නම් ඉදිරියෙන් සඳහන් කොට ඇති විෂයයෙන් සමර්ථ වී ඇති බැව් මෙයින් දැනුම් දෙමි :—

| නම | දෙපාර්තමේන්තුව | විෂය |
|---|---|---|
| ද සිල්වා, ජී. එම්. එම්. වී. (මෙනෙවිය) | රාජ්‍ය භාෂා කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව | ලඝු ලේඛනය |
| ප්‍රනාන්දු, එම්. සී. සී. (මෙනෙවිය) | ගොවිජන සේවා දෙපාර්තමේන්තුව | සිංහල |
| ප්‍රනාන්දු, ඩබ්ලිව්. බී. ටී. එම්. (මෙනෙවිය) | කෘෂිකර්ම සහ ආහාර පිළිබඳ අමාත්‍යංශය | ලඝු ලේඛනය |
| විජේසිංහ, එම්. එච්. එස්. ... | කම්කරු දෙපාර්තමේන්තුව ... | ලඝු ලේඛනය |

2. පහත සඳහන් අපේක්ෂක අපේක්ෂිකාවන් පත්වීම් ස්ථිර කිරීම සඳහා සුදුසුකම් ලැබීමේ පරීක්ෂණයෙන් සමර්ථ වී ඇත :—

| නම | දෙපාර්තමේන්තුව |
|---|---|
| ද සිල්වා, ජී. එම්. එම්. වී. (මෙනෙවිය) | රාජ්‍ය භාෂා කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව |
| ප්‍රනාන්දු, ඩබ්ලිව්. බී. ටී. එම්. (මෙනෙවිය) | කෘෂිකර්ම සහ ආහාර පිළිබඳ අමාත්‍යංශය |
| විජේසිංහ, එම්. එච්. එස්. | කම්කරු දෙපාර්තමේන්තුව |

එච්. ඊ. පීරිස්,
භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්.

1958 දෙසැම්බර් මස 30 වැනි දින,
කොළඹ මහා භාණ්ඩාගාරයේදී ය.

---

# ටැන්ඩර් කැඳවීමේ දැන්වීම්

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### පොල් අතු 25,000ක් සැපයීම

අනුරාධපුරයේ කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරි තැන විසින් පහත උපලේඛනයෙහි සඳහන් පොල් අතු සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර 1959 ජනවාරි මස 23 වන දින පස්වරු 2.30 වනතෙක් භාරගනු ලැබේ. නියමිත පොල් අතු ප්‍රමාණය නියමිත ස්ථානයට සපයා භාරදිය යුතුයි.

2. අනුරාධපුරයේ කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරි තැනගෙන් ෆෝරම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ඒවායෙහි එවිය යුතුයි. සියලුම ටෙන්ඩර් පත්‍ර අනු පිට පතක් සමඟ ලියුම් කවරයක දමා සීල් තබා "කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරි තැන, කෘෂිකර්ම කාර්‍යාලය, අනුරාධපුරය" යන්න එහි පිට ලියා එහිම මුදුනේ වම් කොනෙහි "පොල් අතු සැපයීමේ ටෙන්ඩර් පත්‍රය" යන්න ලියා එවිය යුතුයි.

3. ටෙන්ඩර් පත්‍ර භාරගන්නා අවසාන දින දවල් 12 වනතෙක් ටෙන්ඩර් ෆෝරම දෙනු ලැබේ. ඒ දීම කරන්නේ එක් එක් ටෙන්ඩර් පත්‍රයක් වෙනුවෙන් රුපියල් 10ක් තැන්පත් කළ බවට කච්චේරියක හෝ මහා භාණ්ඩාගාරයේ හෝ කළ යුතුයි. පොරොන්දු පත්‍රය අත්සන් කළ පසු ටෙන්ඩර් තැන්පත් මුදල ආපසු දෙනු ලැබේ. පත්කරගනු ලැබූ ටෙන්ඩර්කරුවාට ඔහුගේ ටෙන්ඩර් පත්‍රය පිළිගත් බව දන්වා 10 දිනක් ඇතුළතදී අවශ්‍ය ඇපය තැබීමට හෝ පොරොන්දු පත්‍රයක් අත්සන් කිරීමට හෝ නොහැකි වුවහොත් ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක වෙනවාත් හැර ඔහුගේ නම රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් වන්ට ඉඩ තිබේ.

4. ටෙන්ඩර් පත්‍ර රෙජිස්ටර් තැපෑලෙන් එවිය යුතුයි. ටෙන්ඩර් පත්‍ර රෙජිස්ටර් තැපෑලෙන් නොඑවතොත් ටෙන්ඩර්කරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් හෝ විසින් අනුරාධපුර කෘෂිකර්ම කාර්‍යාලයේ කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරි තැනට ඒවා අතින්ම භාරදිය යුතුයි. ටෙන්ඩර් බහාලන ලද කවරයෙහි "පොල් අතු සැපයීමේ ටෙන්ඩර් පත්‍රය" යන්න ලියා ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනයද සඳහන් කළ යුතුයි.

5. රෙජිස්ටර් තැපෑලෙන් එවන ලද ටෙන්ඩර් පත්‍ර ලැබුණු බව ඒවා විවෘත කරන දිනයේදීම සියලු ටෙන්ඩර්කරුවන්ට දන්වනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර භාරගැනීම නැවැත්වීමට නියමිත දින සිට දින සතරක් ඇතුළත යම් ටෙන්ඩර්කරුවකුට එවැනි දැන්වීමක් නොලැබුනොත් ඔහු අනුරාධපුරයේ කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරි තැනගෙන් වහාම ඒ ගැන කරුණු විමසිය යුතුයි.

5. ටෙන්ඩර්කරුවන් කැමැති නම් ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී ඔවුන්ට පෙනී සිටීමට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර භාරගැනීම නැවැත්වීමට නියමිත යටකී දිනයේ යටකී වේලාවේදී අනුරාධපුරයේ කෘෂිකර්ම කාර්යාලයේදී ඒවා විවෘත කරනු ලැබේ.

6. නියමිත ෆෝරමයේ ලියා නැති, නැතහොත් එහි නියමිත කොන්දේසි සම්පූර්ණ වශයෙන් ඉටුවී නැති කිසිම ටෙන්ඩර් පත්‍රයක්, ටෙන්ඩර් පත්‍රයක් වශයෙන් සලකනු නොලැබේ. ටෙන්ඩර් ප්‍රමාණයන් සහ ගණන් පැහැදිලි ලෙස තීන්තෙන් ලකුණු කළ යුතුවාත් හැර ඒවා සම්බන්ධයෙන් යම්කිසි වෙනසක් කළහොත් ඒ තැන්වල ටෙන්ඩර් කරුවාගේ කෙටි අත්සන තැබිය යුතුද වේ.

7. ටෙන්ඩර්කරුවන් තම ලිපිනය පැහැදිලි අකුරෙන් ටෙන්ඩර් පත්‍රයෙහි ලිවිය යුතුයි.

8. ටෙන්ඩර් පත්‍රයේ සඳහන් පිළිගනු ලැබුවාවූ දේවල මුළු වියදමෙන් සියයට පහක ඇප මුදලක් කෘෂිකර්ම අධ්‍යක්ෂක තැනගේ නමින් තැන්පත් කිරීමටත් පොරොන්දු පත්‍රයක් අත්සන් කිරීමටත් පත්කරගනු ලැබූ ටෙන්ඩර්කරුවාට නියම කරනු ලැබේ. මේ මුදල ආපසු දෙන්නේ මේ කොන්ත්‍රාත්තුව නිසි පරිදි ඉටුකොට නිමවූ පසුය. පත්කරගනු ලැබූ ටෙන්ඩර්කරුවා මේ කොන්ත්‍රාත්තුව ඉටු නොකළහොත් ඔහුගේ ඇප මුදල රාජසන්තක වෙනවා පමණක් නොව ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත් කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් වෙනවාද ඇත.

9. පොරොන්දු පත්‍රයට ඇලවිය යුතු මුද්දරවල වටිනාකම පත්කර ගනු ලැබූ ටෙන්ඩර්කරුවා විසින් ගෙවිය යුතුයි.

10. ටෙන්ඩර් පත්‍ර භාරගන්නා අවසාන දිනය සිට සති තුනක කාලසීමාවකදී තම ටෙන්ඩර් සලකා බැලීමට ටෙන්ඩර්කරුවන් ඉඩහැරිය යුතුයි.

11. යම්කිසි ටෙන්ඩර් පත්‍රයක් හෝ සියළුම ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂේප කිරීමේත්, ටෙන්ඩර් පත්‍රයක යම්කිසි කොටසක් පිළිගැනීමේත් බලය කෘෂිකර්ම අධ්‍යක්ෂක වෙත තබා ගනී.

12. පත්කරගනු ලැබූ ටෙන්ඩර්කරුවා විසින් ටෙන්ඩර් පත්‍රයේ සඳහන් වැඩය කිරීම සඳහා ලාංකික කම්කරුවන් පමණක් ගත යුතුය. "ලාංකික" යන වචනයේ අර්ථය නම් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ලංකාවේ පුරවැසියෙක්වූ තැනැත්තෙක්ය යන්නයි.

13. කොන්ත්‍රාත් කාරයාට භාරදිය යුතු සියළු දැන්වීම් ඔහුගේ අතට දුන්නොත් නැතහොත් ඔහු විසින් සඳහන් කර ඇති ලිපිනයට තැපෑලෙන් යැව්වොත් ඔහු අතටම භාර දුන්නා කොට සැලකිය යුතුයි.

14. 1934රේ 19 වැනි අංකය දරණ කම්කරු වන්දි ආඥාපණත (117 වෙනි පරිච්ඡෙදය) යටතේ තමාගේ යම්කිසි සේවකයෙකු හෝ සේවකයෙකු වෙනුවෙන් වන්දි ඉල්ලා එවන ඉල්ලුම් පත්‍ර ගැන වගකීමෙන් කොන්ත්‍රාත් කරුවා ආණ්ඩුව නිදහස් කළ යුතුයි.

15. වැඩට ගැනීමට නුසුදුසු යයි කල්පනා කරනු ලබන යම්කිසි කම්කරුවකු කොන්ත්‍රාත් කරුවා වැඩට ගැනීම ගැන විරුඬවීමේ හෝ ඕනෑම කම්කරුවෙකු වැඩට ගැනීම ගැන විරුඬවීමේ හෝ බලය ආණ්ඩුවට තබාගනු ලැබේ.

16. වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත් කරුවන් පිළිබඳ ආණ්ඩුවේ ලැයිස්තුවට තනි තනිව හෝ ඒ ලැයිස්තුවේ නම සඳහන් වෙන කෙනෙකුගේ නම සමග හෝ නම ඇතුලත් වූ හෝ තමාට සෑහේ යැයි පෙනී යන හේතු පිට කෘෂිකර්ම අධ්‍යක්‍ෂ තැන විරුද්ධවන හෝ කිසිවකු සමග කොන්ත්‍රාත් තුවට බැඳෙනු නොලැබේ.

17. ලාංකිකයින්ගෙන් හා ලාංකික සමාගම් සහ ලාංකික වෙළඳ සමාගම් වලින් පමණක් ටෙන්ඩර් පත්‍ර සලකා බලනු ලැබේ.

18. වැඩි විස්තර අනුරාධපුර කෘෂිකර්ම ව්‍යාප්ත නිලධාරි තැනගෙන් දැනගත හැක.

ආර්. ඇෆ්. චන්ද්‍රරත්න,
කෘෂිකර්ම අධ්‍යක්‍ෂක.

පේරාදෙනිය,
1958. 12. 24.

## උපලේඛනය

පොල් අතු (දිග අඩි පහකට වැඩි සහ වියනලද පළල අඟල් 18 කට වැඩි)

| ස්ථානය | අවශ්‍ය ප්‍රමාණය |
|---|---|
| පාසැල් ගොවිපල : මහඉලුප්පල්ලම | 13,500 |
| වියලි ගොඩ ගො. ජනපදය : කුරුන්දන්කුලම | 2,000 |
| වියලි ගොඩ ගො. ජනපදය : ඔලුකරද | 1,500 |
| වියලි ගොඩ ගො. ජනපදය : මාකලානගම | 6,000 |
| වියලි ගොඩ ගොවි ජනපදය : රළපනාව | 2,000 |

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

**පොළොන්නරුවේ රජයේ උක් ගොවිපලේ අක්කර 200ක ගොයම් කැපීම, කුඹුරේ සිට යාර 150ක් පමණ දුර ඇති පාගන ස්ථානයට ගොයම් ගෙන යෑම සහ අඩුක් කිරීම**

1958 දෙසැම්බර් මස 12 වෙනි දින දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ වූ දැන්වීම ගැනයි.

ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනය 1959 ජනවාරි මස 12 වෙනිදා සවස 2.30 දක්වා කල් දමන ලදී.

ටෙන්ඩර් පත්‍ර එදින දවල් 12 දක්වා ලබාගත හැක.

ආර්. ඇෆ්. චන්ද්‍රරත්න,
කෘෂිකර්ම අධ්‍යක්‍ෂක.

1958 දෙසැම්බර් මස 26 වෙනි දින,
පේරාදෙනියේදීය.

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

**සිකුරක්ගොඩ ගොවිපලේ අක්කර 500ක ගොයම් කැපීම, කුඹුරේ සිට යාර 150ක් පමණ දුර ඇති පාගන ස්ථානයට ගොයම් ගෙන යෑම සහ අඩුක් කිරීම**

1958 දෙසැම්බර් මස 12 වෙනි දින දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ වූ දැන්වීම ගැනයි.

ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනය 1959 ජනවාරි මස 12 වෙනිදා සවස 2.30 දක්වා කල් දමන ලදී.

ටෙන්ඩර් පත්‍ර එදින දවල් 12 දක්වා ලබාගත හැක.

ආර්. ඇෆ්. චන්ද්‍රරත්න,
කෘෂිකර්ම අධ්‍යක්‍ෂක.

1958 දෙසැම්බර් මස 26 වෙනි දින,
පේරාදෙනියේදීය.

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

1959 ජනවාරි මස 23 වැනි දින පස්වරු 2.30 දක්වා පහත දක්වෙන සේවාවන් සඳහා ටෙන්ඩර් පත්‍ර මාතර කෘෂිකර්ම කාර්යාලයේ පාලක නිලධාරි තැන විසින් භාරගනු ලැබේ:—

(1) මාපලානේ රජයේ ගොවිපලට වල් අඹ ඇට 5,000ක් හා කොහු අඹඇට 5,000ක් සැපයීම.

(2) මාපලානේ රජයේ ගොවිපළට (දේශීය) පැනිදොඩම් ගෙඩි 3,000ක් සැපයීම.

(3) මාපලානේ රජයේ ගොවිපලට (දේශීය) දෙහි ගෙඩි 3,000ක් සැපයීම.

(4) මාපලානේ රජයේ ගොවිපලට (මල්වානේ) රඹුටන් ගෙඩි 5,000ක් සැපයීම.

(5) මාපලානේ රජයේ ගොවිපලට අලිගැටපේර ගෙඩි 1,500ක් සැපයීම.

(6) මාපලානේ රජයේ ගොවිපලට මැන්ගුස්ටින් ගෙඩි 1,000ක් සැපයීම.

(7) මාපලානේ රජයේ ගොවිපලට ගඩොල් 20,000ක් සහ ගඟේ වැලි "කියුබ්" 9ක් සැපයීම.

(8) ලබුදූවේ රජයේ ගොවිපලට ගඩොල් 30,000 ක් සැපයීම.

(9) මාතර දුම්රිය පලේ සිට කරගොඩ-උයන්ගොඩ ගොවිපලට ලොරිවලින් බඩු ගෙනයාමට සහ එම ගොවිපළෙන් මාතර දුම්රිය පළට බඩු ගෙන ඒමට.

2. ෆෝර්ම කොළ මාතර කෘෂිකර්ම කාර්යාලයේ පරිපාලක නිලධාරි තැනගෙන් ලබාගෙන ඒවායේ ටෙන්ඩර් පත්‍ර (අනුපිටපතක්ද සහිතව) ලියුම් කවරයක දමා සීල් තබා, "පරිපාලක නිලධාරි තැන, කෘෂිකර්ම කාර්යාලය, මාතර", යන්න ලියා එහිම මුදුන් වම් කොනේ "අඹඇට ආදිය සැපයීමේ ටෙන්ඩරය", යන්න ලියා එවිය යුතුයි.

එක් එක් ටෙන්ඩර් පත්‍රයක් වෙනුවෙන් රුපියල් 10 ක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුයි. 1959 ජනවාරි මස 23 වැනි දින දවල් 12 වනතෙක් ටෙන්ඩර් ෆෝර්ම දෙනු ලැබේ. මේ තැන්පත් කිරීම කච්චේරියක හෝ කොළඹ මහා භාණ්ඩාගාරයේ හෝ කළ යුතුයි. පොරොන්දු පත්‍රය අත්සන් කළ පසු ටෙන්ඩර් තැන්පත් මුදල ආපසු දෙනු ලැබේ. පත් කරනු ලැබූ ටෙන්ඩර්කරුවාට ඔහුගේ ටෙන්ඩර පත්‍රය පිළිගත් බැව් දන්වා දස දිනක් ඇතුලතදී අවශ්‍ය ඇපය තැබීමට හෝ පොරොන්දු පත්‍රයක් අත්සන් කිරීමට හෝ නොහැකි වුවහොත් ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක වෙනවාත් හැර ඔහුගේ නම රජයේ වැඩ පැහැර ඇරිය කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට ඇතුලත් කිරීමටද ඉඩ තිබේ.

3. ටෙන්ඩර් පත්‍ර මාතර කෘෂිකර්ම කාර්යාලයේ ටෙන්ඩර් පත්‍ර පෙට්ටියේ තැන්පත් කළ යුතුයි. එසේ නැතිනම් ඒවා රෙජිස්ටර් තැපැලෙන් එවිය යුතුයි. රෙජිස්ටර් තැපෑලෙන් නොඑවන ටෙන්ඩර් පත්‍ර ටෙන්ඩරකරුවන් විසින් හෝ ඔවුන්ගේ ඒජන්තවරුන් විසින් හෝ මාතර කෘෂිකර්ම කාර්යාලයේ පාලන නිලධාරි තැනට භාරදිය යුතුයි. එම ටෙන්ඩර පත්‍ර බහාලන ලද කවරයෙහි "අඹඇට ආදිය සැපයීමෙහි ටෙන්ඩරය" යන්න ලියා ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනයද සඳහන් කළ යුතුයි.

රෙජිස්ටර් තැපෑලෙන් එවන ලද ටෙන්ඩර් පත්‍ර ලැබුණු බව ඒවා විවෘත කරන දිනයේදීම දන්වනු ලැබේ. යම් ටෙන්ඩර්කරුවෙක් විසින් එවැනි දැන්වීමක් ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීමට නියමව තිබූ දින සිට දින 4ක් ඇතුලත නොලැබුනේ නම්, ඒ ගැන මාතර කෘෂිකර්ම කාර්යාලයේ පාලන නිලධාරි තැනගෙන් වහාම විමසිය යුතුයි.

4. ටෙන්ඩර්කරුවන්ට උවමනානම්, ටෙන්ඩර් පත්‍ර විවෘතකරන වේලාවේදී ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ. ටෙන්ඩර පත්‍ර භාරගැනීම නැවැත්වීමට නියමිත යට කී දිනයේ යට කී වේලාවේ දී මාතර කෘෂිකර්ම කාර්යාලයේ ඒවා විවෘත කරනු ලැබේ.

5. නියමිත ෆෝර්මයේ ලියා නැති, නැතහොත් එහි නියමිත කොන්දේසි සම්පූර්ණ වශයෙන් ඉටුවී නැති කිසිම ටෙන්ඩර් පත්‍රයක් ටෙන්ඩර් පත්‍රයක් ලෙස සලකනු නොලැබේ. ප්‍රමාණයන් (Rates) සහ ගණන් පැහැදිලි ලෙස තීන්තෙන් ලකුණු කලයුතුවාත් හැර ඒවා සම්බන්ධයෙන් යම්කිසි වෙනසක් කළහොත් ඒ තැන්වල ටෙන්ඩර් කරුවාගේ කෙටි අත්සනද තැබිය යුතුද වේ.

6. ටෙන්ඩර්කරුවන් තම ලිපිනය පැහැදිලි අකුරෙන් ටෙන්ඩර්පත්‍ර යෙහි ලිවිය යුතුයි.

7. ටෙන්ඩර් පත්‍රයේ සඳහන් වූද පිළිගනු ලැබුවාවූද අඹඇට වලට/පැනිදොඩම් වලට/දෙහි වලට/රඹුටන් වලට/අලිගැටපේර වලට/මැන්ගුස්ටින් වලට/ගඩොල් වලට හා වැලිවලට යන මුළු වියදමෙන් සියයට පහක ඇප මුදලක් කෘෂිකර්ම අධ්‍යක්‍ෂක තැනගේ නමින් තැන්පත් කිරීමටත් පොරොන්දු පත්‍රයක් අත්සන් කිරීමටත් පත් කරනු ලැබූ ටෙන්ඩර්කරුවනට නියම කරනු ලැබේ. මේ මුදල ආපසු දෙන්නේ මේ කොන්ත්‍රාත්තුව නිසි පරිදි ඉටුකොට නිම වූ විට පමණකි. පත් කරන ලද ටෙන්ඩර්කරු මේ කොන්ත්‍රාත්තුව ඉටු නොකළහොත් ඔහුගේ ඇප මුදල රාජසන්තක වනවා පමණක් නොව, ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත් කාරයින්ගේ ලැයිස්තුවට ඇතුලත් වනවා ඇත.

8. පොරොන්දු පත්‍රයකට ඇලවිය යුතු මුද්දරවල වටිනාකම පත් කරනු ලැබූ ටෙන්ඩර්කරුවා විසින් ගෙවිය යුතුයි.

9. ටෙන්ඩර් පත්‍ර බාරගැනීම නැවැත්වූ දින සිට සති තුනක් යන තුරු ටෙන්ඩර්කරුවන් එම ටෙන්ඩර පත්‍ර සැලකිල්ලට භාජන කිරීමට ඉඩ තැබිය යුතුය.

10. ඉහත සඳහන් ඇට/ගෙඩි/ගඩොල්/වැලි සියල්ලම සපයා දෙන ලෙස නියම කිරීමට කෘෂිකර්ම අධ්‍යක්ෂක තැන ඇප නොවේ. යම්කිසි ටෙන්ඩර් පත්‍රයක් හෝ සියළුම ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂේප කිරීමටද ටෙන්ඩර් පත්‍රයක යම්කිසි කොටසක් පිළිගැනීමටද උවමනා ප්‍රමාණයක් සපයා දෙන ලෙස නියම කිරීමටද බලය ආණ්ඩුව තබා ගනු ලැබේ.

11. තෝරා ගන්නා ලද ටෙන්ඩර්කරු විසින් ටෙන්ඩර් පත්‍රයේ සඳහන් වැඩය කිරීම පිණිස ලාංකික කම්කරුවන් පමණක් යෙදවිය යුතුය. ලාංකික යන වචනයේ අර්ථය නම් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් ලංකාවේ රට වැසියෙක් වූ තැනැත්තෙක්ය යන්නයි.

12. තමාගේ යම්කිසි සේවකයකු හෝ සේවකයකු වෙනුවෙන් 1934 19 වැනි අංකය දරණ කම්කරු වන්දි ආඥපනත (117 වැනි පරිච්ෙඡදය) යටතේ වන්දි ඉල්ලා එවන ඉල්ලුම් පත්‍ර ගැන වගකීමෙන් කොන්ත්‍රාත්කරු ආණ්ඩුව නිදහස් කළ යුතුයි.

13. කොන්ත්‍රාත්කාරයාට භාරදිය යුතු සියළුම දැනුම්දීම් ඔහුගේ අතට දුන්නොත් නැතහොත් ඔහු විසින් සපයන ලද ඔහුගේ ලිපිනයට තැපැලෙන් යැව්වහොත් ඔහුට භාර දුන්නා ලෙස සැලකිය යුතුයි.

14. යම්කිසි වැඩකරුවෙක් මේ වැඩෙහි යෙදවීම ගැන විරුද්ධ වීමට බලය ආණ්ඩුව සතු තබාගනු ලැබේ.

15. දෙපාර්තමේන්තුවේ යහපත සඳහා කෘෂිකර්ම අධ්‍යක්ෂක තැනට ඉහත සඳහන් ඇට/ගෙඩි/ගඩොල්/වැලි සියල්ලම මිළයට නොගත යුතුයි පෙනී ගියහොත් එසේ මිළයට නොගැනීම හේතුකොට ගෙන ආණ්ඩුවෙන් වන්දි මුදලක් ගැනීමට ඔහුට බලයක් නොලැබේ.

16. වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන් පිළිබඳ ආණ්ඩුවේ ලැයිස්තුවට තනි තනිව හෝ ඒ ලැයිස්තුවේ නම සඳහන් වෙන කෙනෙකුගේ නම සමග හෝ නම ඇතුලත් වූ හෝ තමාට සෑහේයයි පෙනී යන හේතුපිට කෘෂිකර්ම අධ්‍යක්ෂක තැන විරුද්ධ වන හෝ කිසිවකු සමග කොන්ත්‍රාත්තුවකට බැඳෙනු නොලැබේ.

17. තෝරා ගන්නා ලද ටෙන්ඩර්කරු විසින් ඇපකරුවන් දෙදෙනකු සොයාගෙන ඔහුගේ වියදමින්ම පොරොන්දු පත්‍රයකට අත්සන් තැබිය යුතුයි. එම ඇපකරුවන් කෘෂිකර්ම අධ්‍යක්ෂක තැන විසින් අනුමත කළයුතුයි.

18. සපයන ලද ඇට/ගෙඩි/ගඩොල්/වැලි සතුටුදායක නොවීමත් කොන්ත්‍රාත්තුවේ කොන්දේසි ඉටු නොකිරීමත් නිසා කොන්ත්‍රාත්තුව නතර කිරීමේ බලය කෘෂිකර්ම අධ්‍යක්ෂක තැනට තබාගනු ලැබේ.

19. වැඩි විස්තර මාතර කෘෂිකර්ම කාර්යාලයේ පාලන නිලධාරි තැනගෙන් දැනගත හැක.

එම්. එෆ්. චන්ද්‍රරත්න,
කෘෂිකර්ම අධ්‍යක්ෂතැන.

1958 දෙසැම්බර් 29 වැනි දින,
පේරාදෙනියේ දීය.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

කොළඹ කොටාරෝඩ්හි බටහිර කොට්ඨාශය භාර ප්‍රදේශීය වාරිමාර්ග ඉංජිනේරු තුමා විසින් හුලංද ඔය ජලාශය ව්‍යාපාරයේ අඩ් තාවකාලික නොම්මර 3 දරණ කම්කරු නිවාසයක් තැනීම සඳහා 1959 ජනවාරි මස 23 දින පෙරවරු 11.30 දක්වා මෙම දෙපාර්තමේන්තුවේ රුපියල් 15,000කට හෝ ඊට වැඩි ගණනකට ලියාපදිංචිවූ කොන්ත්‍රාත්කරුවන්ගෙන් ටෙන්ඩර් භාර ගනු ලැබේ.

2. හුලංද ඔය ජලාශ ව්‍යාපාරය භාර ඉංජිනේරු තැනගෙන් ලබාගත් ටෙන්ඩර් ෆෝර්මවල ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුයි. ටෙන්ඩර් දෙක බැගින් එවිය යුතුයි.

3. 1959 ජනවාරි මස 6 වැනි දින සිට 21 වැනි දින දක්වා (දෙදිනම ඇතුළුව) ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ. ටෙන්ඩර් ෆෝර්ම ලබාගැනීම සඳහා කච්චේරියක රුපියල් 25ක් තැන්පත් කොට ලබා ගත් කුවිතාන්සියක් ද ලියාපදිංචිකරන ලද පොතද ඉදිරිපත් කළ යුතුයි. දැනට රජයේ කොන්ත්‍රාත් ලබා තිබෙන අය වැඩ හෝ වැඩය භාර නිලධාරීන්ගෙන් එම වැඩ සතුටුදායක ලෙස කරගෙන යන බවට සහ දැනට තිබෙන වැඩ ප්‍රමාණය ගැනද සහතික ඉදිරිපත් කළ යුතුයි.

ඇම්. ජේ. ඇෆ්. ආර්. සේනාරත්න,
හුලංද ඔය ජලාශය ව්‍යාපාරය භාර ඉංජිනේරු තැන.

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරුතුමා විසින් ත්‍රිකුණාමලේ වාරිමාර්ග කාර්යාලේදී, කන්තලේ ස්ථිර ඕවර්සියර්වරුන්ගේ නිවාස සෑදීම සඳහා 1959 ජනවාරි 13 වෙනි අඟහරුවාදා උදේ 9.30 වන තුරු රු. 20,000 කට සහ ඊට වැඩි ගණනකට ටැන්ඩර් බාරගනු ලැබේ.

ටැන්ඩර් බාරගනු ලබන්නේ දෙපාර්තමේන්තුවේ රෙජිස්ටර්වූ කොන්ත්‍රාත්කරුවන්ගෙන් පමණය.

ටැන්ඩර් පත්‍ර ඉදිරිපත් කළයුත්තේ පිටපත් දෙකකින්ය. ටැන්ඩර් පත්‍රත් සියලු විස්තරත් කන්තලේ වාරිමාර්ග ඉංජිනේරුතුමාගෙන් ලබාගත හැක.

ටැන්ඩර් පත්‍ර 1959 ජනවාරි 6 වෙනිදා සිට 9 වෙනිදා දක්වා නිකුත් කරනු ලැබේ.

ටැන්ඩර් පත්‍ර නිකුත් කරනු ලබන්නේ, කච්චේරියේ හෝ කන්තලේ වාරිමාර්ග කාර්යාලයේ රු. 25ක් තැන්පත්කර ගත් රිසිට් පතක් ඉදිරිපත් කරන දෙපාර්තමේන්තුවේ රෙජිස්ටර් කොන්ත්‍රාත් කරුවන්ට පමණය.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

පොළොන්නරුවේ ඊසාන ප්‍රදේශීය වාරිමාර්ග ඉංජිනේරුතුමා විසින් මින්නේරියේ පහත සඳහන් ගොඩනැගිලි සෑදීම සඳහා මෙම දෙපාර්තමේන්තුවේ පිළිවෙලින් රුපියල් 12,000, 18,000, 22,000, 25,000 සහ 25,000 හෝ ඉන් ඉහළ ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත් කරුවන්ගෙන් වෙන වෙන ටෙන්ඩර් පත්‍ර 1959 ජනවාරි මස 21 වෙනි බදාදා පෙරවරු 9.30 දක්වා භාරගනු ලැබේ :—

(1) ගබඩාවක් ;
(2) කම්කරු නිවාසයක් ;
(3) කනිෂ්ඨ ලිපිකරු සහ ගබඩා භාර නිලධාරි නිවාස 5ක් ;
(4) ජ්‍යෙෂ්ඨ ලිපිකරු නිවසක් ; සහ
(5) ජ්‍යෙෂ්ඨ කාර්මික උප නිලධාරි නිවාසයක්.

1959 ජනවාරි මස 12 වෙනි දින සිට 17 වෙනි දින දක්වා හිඟුරක්ගොඩ, තමන්කඩුව උප කොට්ඨාශයේ වාරිමාර්ග ඉංජිනේරු තුමා විසින් ටෙන්ඩර් පත්‍රිකා නිකුත් කරනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර ලබා ගනු කැමැත්තන් එක එක ටෙන්ඩරයට රුපියල් 25 බැගින් තමන්කඩුව උප කොට්ඨාශයේ වාරිමාර්ග ඉංජිනේරු මහතා වෙත තැන්පත් කළ යුතුය.

මේ සම්බන්ධ සියලු විස්තර සඳහා තමන්කඩුව උප කොට්ඨාශයේ වාරිමාර්ග ඉංජිනේරු තුමාගෙන් විමසන්න.

ජී. ඇස්. ඇම්. ෂොක්මන්,
වාරිමාර්ග ඉංජිනේරු තැන.
තමන්කඩුව උප කොට්ඨාශය.

24.12.1958,
වාරිමාර්ග කාර්යාලය, හිඟුරක්ගොඩ.

---

## ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව

### වහල සෙවිලි කරන මෙරට උළු සැපයීම

ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවට මෙරට සාදන ලද පිළිගත් වර්ගවල සෙවිලි උළු සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර 1959 ජනවාරි මස 27 වෙනි කුජ දින පෙරවරු 10 තෙක් ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් භාරගනු ලැබේ.

2. 1959 ජනවාරි මස 27 වැනි අඟහරුවාදා පස්වරු 2.30ට මෙම ටෙන්ඩර් පත්‍ර කොළඹ ගාලු මූවදෙර මහලේකම් ගොඩනැගිල්ලේ 362 වෙනි මැදිරියේදී කඩා බලන බැවින් ටෙන්ඩර්කරුවන්ට සතුටු නම් මෙකී වේලාවට පැමිණ සිටිය හැකිය.

3. ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කිරීමේදී කොළඹ ගාලු මූවදෙර මහලේකම් ගොඩනැගිල්ලේ ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂක තුමාගෙන් 1959 ජනවාරි 13 වෙනි දින තෙක් ලබා ගත හැකි ටෙන්ඩර් පත්‍ර, අනු පිටපතක් සමග ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් පත්‍ර නිකුත් කිරීමට ප්‍රථම මෙම කාර්යාලයේ හෝ කොළඹින් පිට කච්චේරියක රු. 100ක මුදලක් තැන්පත් කොට ඒ සඳහා ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය.

4. දළු වශයෙන් පැතලි උළු ලක්ෂ 45ක් සහ මුදුන් උළු 30,00,000ක් පහත පෙනෙන ඉඩම් සංවර්ධන නිලධාරි තුමන්ලාගේ ව්‍යාපාරයන් අතර බෙදා හැරීම සඳහා අවශ්‍යය. මෙකී ගණන් අස්ථිරය.

| | | පැතලි උළු | මුදුන් උළු |
|---|---|---|---|
| ඉ. ස./නි., | පොළොන්නරුව ... | 683,500 ... | 42,600 |
| ඉ. ස./නි., | බදුල්ල ... | 586,700 ... | 50,600 |
| ඉ. ස./නි., | මොණරාගල ... | 87,000 ... | 5,500 |
| ඉ. ස./නි., | මාතර ... | 113,500 ... | 7,000 |
| ඉ. ස./නි., | නුවර ... | 132,000 ... | 8,300 |
| ඉ. ස./නි., | අනුරාධපුර ... | 437,000 ... | 27,000 |
| ඉ. ස./නි., | පාවට්කුලම ... | 183,000 ... | 11,400 |
| ඉ. ස./නි., | කිලිනොච්චි ... | 320,000 ... | 19,000 |
| ඉ. ස./නි., | පදවිය ... | 503,000 ... | 31,400 |
| ඉ. ස./නි., | දඹුල්ල ... | 890,000 ... | 74,000 |
| ඉ. ස./නි., | අඹන්පොල ... | 300,000 ... | 14,300 |

මේ පිළිබඳ සම්පූර්ණ විස්තර ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂක තැනගෙන් ලබාගත හැකිය.

ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂක.

ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව, කොළඹ.
58.12.23.

---

## ආහාර දෙපාර්තමේන්තුව

### ආහාර සහ කිරි පිටි ලොරි වලින් ගෙන යාම

වර්ෂ 1959ක්වූ පෙබරවාරි මස 1 වෙනි දින සිට 1959ක්වූ සැප්තැම්බර් මස 30 වැනි දින දක්වා කාලය තුළ පහත සඳහන් සේවය සඳහා ටෙන්ඩර් 1959 ජනවාරි මස 15 වෙනි බ්‍රහස්පතින් දා පස්වරු 2.30 දක්වා කොළඹ, යූනියන් පෙදෙසේ (අංක 564 දරණ තැපැල් පෙට්ටිය) ආහාර හා කෘෂිකර්ම අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් භාරගනු ලැබේ.

සේවය : බුසල් ආහාර පාලක ගබඩාවල සිට පහත සඳහන් ප්‍රදේශයන්හි පිහිටි සපයන ස්ථානවලට සහ/හෝ සමූපකාර සංගම යන්ට ආහාර සහ කිරි පිටි ලොරි වලින් ගෙන යෑම.

ප්‍රදේශ නො. 1. අම්බලන්ගොඩ, ගාල්ල, වැල්ලබොඩපත්තු, ඉඳුරුව, බස්නාහිර බෙන්තර වලල්ලාවිට කෝරළේ, හික්කඩුව, බද්දේගම යනාදි.

ප්‍රදේශ නො. 2. ගාල්ල, ඇල්පිටිය යනාදි.

ප්‍රදේශ නො. 3. අහංගම, වැලිගම යනාදි.

කොළඹ යූනියන් පෙදෙසේ ආහාර කොමසාරිස් තැනගේ කාර්‍යාල යෙන් 1959 ජනවාරි 12 වෙනි සඳුදා දවල් 12 තෙක් ලබාගත හැකි පෝර්මවල ටෙන්ඩර් (පිටපත් දෙකකින්) ඉදිරිපත් කළ යුතු වේ. ටෙන්ඩර් පෝර්ම ලබා ගැනීම සඳහා ආහාර කොමසාරිස් වෙත රුපියල් 100ක් තැන්පත් කොට ලබා ගන්නා කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුවාත් හැර විස්තර ප්‍රකාශනයේ 4 (ii) සහ (iii) දරන ඡේදයන්හි සඳහන් ලියවිලි ද ඉදිරිපත් කළ යුතු වේ. මෙම විස්තර ප්‍රකාශනය ද අමතර විස්තර ද ආහාර කොමසාරිස්ගේ කාර්‍යාලයෙන් ලබාගත හැක.

කේ. ඇම්. ඩී. ජයනෙත්ති,
ආහාර කොමසාරිස්.

1958 දෙසැම්බර් 24 වැනි දින,
330, යූනියන් පෙදෙස,
කොළඹ.

---

## අලෙවිකිරීමේ දෙපාර්තමේන්තුව

### කරවල සැපයීම

අලෙවිකිරීමේ දෙපාර්තමේන්තුවට අයත් මරදානේ, ත්‍රිපොලියෙහි පිහිටි ආරෝග්‍යශාලාවලට, කැම සපයන අංශයේ ප්‍රධාන ආයතනයට හා බොරැල්ලේ තිබෙන අලෙවිකිරීමේ දෙපාර්තමේන්තුව සතු මුහුනැස්ගෙළ සහ මරදානේ තිබෙන බාර්ලි රෝඩ් ගබඩාවටත් 1959. 2. 1 දින සිට 1959. 3. 31 දක්වා අවසන් වන කාලය තුළ කරවල සැපයීම පිණිස ටෙන්ඩර් ඉල්ලුම් පත්‍ර කොළඹ යූනියන් ප්ලේස්හි පිහිටි කෘෂිකර්ම හා ආහාර අමාත්‍ය කාර්‍යාංශයේ ටෙන්ඩර් බෝඩ් කොමිටියේ සභාපති තුමා විසින් 1959. 1. 16 වෙනි සිකුරාදා සවස 2.30 වෙනතුරු භාරගනු ලැබේ.

ටෙන්ඩර් පත් කොළඹ කොටුවේ චැතැම් වීදියේ අංක 62 දරන අලෙවිකිරීමේ කාර්‍යාලයෙන් ලබා ගන්නා ලද පෝරමවල ලියා අනු පිටපතක් ද සමඟ එව්ය යුතුය. කොළඹ කොටුවේ චැතැම් වීදියේ අංක 62 දරන අලෙවිකිරීමේ කොමසාරිස් කාර්‍යාලයට හෝ කොළඹින් බැහැර ඕනෑම කච්චේරියකට රු. 150ක් බැඳ කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට 1959 ජනවාරි 16 වෙනි සිකුරාදා දවල් 12 වන තෙක් ටෙන්ඩර පෝරම ලබාගත හැක. වැඩි විස්තර කොළඹ කොටුවේ චැතැම් වීදියේ අංක 62 දරන අලෙවිකිරීමේ කොමසාරිස් කාර්‍යාල යෙන් දැන ගැනීමට පුළුවන.

ඒ. ඩබ්ලිව්. ආර්. පෙරේරා,
අලෙවිකිරීමේ කොමසාරිස් තුමා වෙනුවට.

අලෙවිකිරීමේ දෙපාර්තමේන්තුව,
62, චැතැම් වීදිය,
කොළඹ 1, 1958. 12. 29 දින්ය.

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

### ක්‍රීඩා භාණ්ඩ සැපයීම සඳහා ටැන්ඩර් පත්‍ර—1958/59

ක්‍රීඩා භාණ්ඩ සැපයීම සඳහා 1959 ජනවාරි මස 23 වන කිවි දින පස්වරු 2.30 වන තෙක් කොළඹ 2, මලයි වීදියේ අධ්‍යාපන දෙපාර්ත මේන්තුවේ ටැන්ඩර් මණ්ඩලයේ සභාපතිවරයා විසින් ටැන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ.

2. ටැන්ඩර් පත්‍ර එවීමට බලාපොරොත්තුවන අය විසින් විස්තර ලේඛන ඉල්ලා සිටි විට අධ්‍යාපනාධ්‍යක්ෂවරයා වෙනුවෙන් කොළඹ 2, මලයි වීදියේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ බඩුබාහිරු සැපයීමේ ශාඛාව විසින් ඒවා ඔවුනට නොමිලයේ සපයනවා ඇත.

3. කොළඹ ටැන්ඩර් කරු භවතුන් විසින් අධ්‍යාපනාධ්‍යක්ෂ තැන නමට කොළඹ 2, මලයි වීදියේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ඒ. සී. ශාඛාවෙහිද, කොළඹින් පිට අය විසින් කොළඹින් පිට කච්චේරියක ද රු. 100 ක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට 1959 ජනවාරි මස 22 වන දින තෙක් සාමාන්‍ය රාජකාරි කාලය තුළදී ටැන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ.

ඇල්. ඩී. ඇස්. කරුණාරත්න,
අධ්‍යාපන අධ්‍යක්ෂ වෙනුවට.

1958 දෙසැම්බර් මස 29 වන දින,
කොළඹ 2, මලයි වීදියේ,
අධ්‍යාපන දෙපාර්තමේන්තුවේදීය.

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

1959 ජනවාරි මස 23 වන කිවි දින පෙරවරු 10.30 වන තෙක් පහත සඳහන් වන වැඩ සඳහා ටැන්ඩර් පත්‍ර කොළඹ 3, බ. ප. අධ්‍යාපන කාර්යාලයේ ටැන්ඩර් පත්‍ර මණ්ඩලයේ සභාපති තැන විසින් භාර ගනු ලැබේ :—

| පාසැලේ නම | කළයුතු වැඩය |
|---|---|
| 1. කො./පාලුගම් ජ්‍යෙෂ්ඨ පාසැල | රසායනාගාරයේ උපකරණ සවිකිරීම |
| 2. කො./බියගම ජ්‍යෙෂ්ඨ පාසැල | රෙපයේරුව සහ අමතර වැඩ |
| 3. මී./ගාල්ලේ ගෙදර මී. පා. ... | රෙපයේරුව |
| 4. මී./තවලම්පිටිය මී. පාසැල ... | අමතර වැඩ |
| 5. මී./උඩුගම්පොල ජ්‍යෙෂ්ඨ පාසැල | අමතර වැඩ |

සංලක්ෂය.—කො = කොළඹ දිස්ත්‍රික්කය.
මී = මීගමු දිස්ත්‍රික්කය.

2. අංක 1-5 යන වැඩ වලට රු. 5,000කට හෝ ඊට වැඩි ගණනකට ගොඩනැගිලි තැනීම සඳහා අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හෝ අංක 1-5 යන වැඩ වලට රු. 10,000කට හෝ ඊට වැඩි ගණනකට ගොඩනැගිලි තැනීම සඳහා ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ ලියාපදිංචිව සිටින්නා වූද, අධ්‍යාපන අධ්‍යක්ෂ තැනගේ කාර්යාලයේ (ඒ. සී. ශාඛාවේ) හෝ කොළඹින් පිට කච්චේරියක හෝ රු. 100ක මුදලක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් කොළඹ 3, බස්නාහිර පළාතේ අධ්‍යාපන නිලධාරි තැනට ඉදිරිපත් කරන්නාවූද අයට, 1959.1.22 වන දින පස්වරු 3.30 වන තෙක් ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ. චැක් පත්, මනි ඕඩර්, පෝස්ටල් ඕඩර් යනාදිය භාර ගනු නොලැබේ.

3. ටෙන්ඩර් පත්‍ර ඉල්ලුම් කරන අවස්ථාවේදී දැනට රජය යටතේ ඇති කොන්ත්‍රාත් සම්බන්ධව පහත සඳහන් පරිදි සහතිකයක් ටැන්ඩර්කරුවන් විසින් ඉදිරිපත් කළ යුතුයි.

| වැඩයේ නම | කොන්ත්‍රාත්තුවේ දිනය | කොන්ත්‍රාත්තුවේ මුළු ගණන | වැඩය අවසාන කිරීමට නියමිත දිනය (කල් දීම් ඇතිව) | වැඩය සතු වුදයකද අසතුවුදය කදයනා වග | දෙපාර්තමේන්තුවේ ප්‍රදේශීය ප්‍රධාන තැනගේ අත්සන |
|---|---|---|---|---|---|

ඉහත සඳහන් වන්නේ මවිසින්/අප විසින් කොන්ත්‍රාත් ගෙන තිබෙන සියලුම වැඩ වල සම්පූර්ණ විස්තරයක් බැව් සහතික කරමි/කරමු.

ටැන්ඩර් කරුගේ අත්සන :————.

දිනය :————.

ඉයදවීමට අවසරයක් දුන්නොත් හැර එසේ අවසරයක් නොමැතිව එවැනි කම්කරුවන් සේවයේ යෙදවීම කොන්ත්‍රාත්තුව අවලංගු කිරීමට හේතුවන බව සැලකිය යුතුයි. අනුමැතියක් හෝ සම්මතියක් නොමැතිව ලාංකික නොවන කම්කරුවන් හෝ වෙන ප්‍රදේශවල පදිංචි කම්කරුවන් හෝ යෙදවීම තහනම්ය.

ඊ. නාගොඩවිතාන,
උඹව පළාතේ අධ්‍යාපන නිලධාරි තැන.

අධ්‍යාපන කායඹාලය,
බණ්ඩාරවෙල, 1958.12.22.

---

## බන්ධනාගාර දෙපාර්තමේන්තුව

### අනවශ්‍ය කෑම ද්‍රව්‍ය සහ කෑම වර්ග මිළදී ගැනීම

1959 පෙබරවාරි 1 වෙනි දින සිට 1962 ජනවාරි මස 31 වෙනි දින දක්වා ඇති තුන් අවුරුද්ද තුළ වැලිකඩ බන්ධනාගාරයේ සහ රිමාන්ඩ් සිරසැලෙහි දිනපතා ඉතිරිවන කෑම ද්‍රව්‍ය හා මුළුතැන්ගෙයින් ඉවත දමන අනවශ්‍ය කෑම වගී මිල දී ගැනීම සඳහා ටෙන්ඩර් පත්‍ර 1959 ජනවාරි මස 17 වෙනි සෙනසුරාද දවල් 12 දක්වා වැලිකඩ බන්ධනාගාර අධිකාරි තැන විසින් භාරගනු ලැබේ. සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර එවන කවරවල වම් පස උඩ කෙළවරේ " ඉතිරිවන කෑම ද්‍රව්‍ය සහ මුළුතැන්ගෙයින් ඉවත දමන අනවශ්‍ය කෑම වර්ග " යනුවෙන් සඳහන් කළ යුතුයි.

මේ කොන්ත්‍රාත්තුවට අදාල සියලු විස්තර පහත සඳහන් ලිපින යෙන් ලබා ගත හැක. පහත සඳහන් නමට ටෙන්ඩරය වෙනුවෙන් රුපියල් 10ක් තැන්පත් කර එම කුවිතාන්සිය ටෙන්ඩරයට අමුණා එවිය යුතුයි.

පො. කුමාරසවාමි,
වැලිකඩ බන්ධනාගාර අධිකාරී.

1958 දෙසැම්බර් 29 වැනිදා,
වැලිකඩ බන්ධනාගාරයේදීය.

---

## බන්ධනාගාර දෙපාර්තමේන්තුව

### රබර් කිරි මිලදී ගැනීම

1959 පෙබරවාරි මස 15 වැනි දින සිට ජූනි මස 14 වැනි දින දක්වා අතර කාලය තුළ කුන්ඩසාලේ එලිමහන් සිර කඳවුරේ රබර් කිරි මිලදී ගැනීම සඳහා එලිමහන් සිරකඳවුරේ සහකාර අධිකාරි තුමා විසින් 1959 ජනවාරි මස 28 වැනි දින පූ. භා. 9 දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ.

ළඟම පිහිටි කච්චේරියේ හෝ කොළඹ බන්ධනාගාර කොමසාරිස් තුමාගේ කායඹාලයේ රුපියල් 10ක් තැන්පත් කර කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් පහත අත්සන් කරන මගෙන් ජනවාරි මස 27 වැනි දින පස්වරු 4 වනතුරු ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබාගත හැක. ටෙන්ඩර් ආකෘති පත්‍ර සමඟ අනු ආකෘති පත්‍රයක් ද විය යුතුයි.

ටෙන්ඩර් ආකෘති පත්‍ර සීල් කරන ලද කවරයක බහා වම් කෙළවරේ " රබර් කිරි " යයි සඳහන් කර රිජිස්ටර් තැපෑලෙන් හෝ නොඑසේ නම් ඒ සඳහා කුන්ඩසාලේ සිර කඳවුරේ තබා ඇති පෙට්ටියෙහි දැමිය යුතුයි. ටෙන්ඩර් පත්‍රයෙහි සඳහන් කරන මිල අකුරෙන් හා ඉලක්කමෙන් විය යුතුයි.

තෝරාගත් ටෙන්ඩර් කරුට දන්වා යවා සතියක් තුළදී සහකාර අධිකාරීතුමා සමඟ කොන්දේසියකට නොබැඳුනහොත් ඔහු විසින් තැන්පත් කළ රුපියල් 10 රජය සතු වෙනවා ඇත.

කොන්ත්‍රාත්තුව නිසියාකාර ශෙනයාම සඳහා ටෙන්ඩර්කරු විසින් රුපියල් 25 ක ඇපයක් තැබිය යුතුයි.

ටෙන්ඩර්කරුවනට ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී පැමිණ සිටීමට ඉඩදෙනු ලැබේ.

ඉදිරිපත් කරන ලද ටෙන්ඩරය භාරගත් අවසාන දින සිට සති 3කට වලංගු ලෙස සලකනු ලැබේ.

කේ බී. අලහකෝන්,
සහකාර අධිකාරී තැන.

එලිමහන් සිරකඳවුර,
කුන්ඩසාලේ.

---

## ධීවර දෙපාර්තමේන්තුව

### මුදවපු කුකුළන් ගැනීම

වෂ් 1959 ක්වූ ජනවාරි මස 16 වෙනි සිකුරාද පෙරවරු 10.30 වන තේක් කොළඹ, ගාලු මුවදොර, ධීවර පර්යේෂණගාරයේ ධීවර අධිකාරි තැන විසින් මුදවාපු කුකුළන් ගැනීම සඳහා ටෙන්ඩර බාර ගන්නවා ඇත.

2. ඔහුගෙන් ෆෝර්ම කොළ ලබාගෙන මිළ ගණන් ලියා අනු පිට පතක් ද සහිතව එවිය යුතුයි. වැඩි විස්තරද ඔහුගෙන් ලබා ගත හැක.

3. තැන්පත් මුදලක් වශයෙන් රු. 50 බැඳ ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට ෆෝර්ම කොළ දෙනු ලැබේ.

ඩී. පී. ඊ. ඒ.. ද ෆොන්සේකා,
ධීවර අධිකාරී.

ධීවර පර්යේෂණාගාරය,
ගාලු මුවදොර,
කොළඹ,
30.12.58.

---

## රේගු දෙපාර්තමේන්තුව

### රන් පොලු සහ මුදු විකිණීම

පහත සඳහන් රන් පොලු සහ මුදු විකිණීම සඳහා ගෘහ කර්මාන්ත දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ තුමන්ගේ බලය ලත් රජයේ ලියාපදිංචි වී ඇති සවර්ණාභරණ නිපදවන්නන්ගෙන් ටෙන්ඩර් පත් භාරගනු ලැබේ :—

(1) පී. ඕ. නො. එම්. 142/58 (ඒ) රන් පොලු ... 4 යි
(බී) රන් මුදු ... 4 යි

2. ටෙන්ඩර් පත් කවරයක බහා හස් (මුද්‍රා) තබා කවරයෙහි වම් ඉහල කෙළවරේ "Tender for Gold Bullion" යයි සඳහන් කර කොළඹ ප්‍රධාන රේගු අයකැමි තුමාට එවිය යුතු යි.

3. ටෙන්ඩර් භාර ගැනීම 1959 ජනවාරි 9 වැනි සිකුරාද පෙ. ව. 10ට නිම වෙයි. රේගුවේ නියෝජ්‍ය අයකැමි විසින් ටෙන්ඩර් විවෘත කරන විට ටෙන්ඩර් කරුවන්ට එය නැරඹීමට අවසර දෙනු ලැබේ.

4. ටෙන්ඩර් පිළිබඳ නියමිත පුරවුපත් (ෆෝම්ස්) කොළඹ රේගු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන නිවාරණ නිලධාරි තැනගෙන් ලබා ගත හැක්කේ එක් එක පුරවු පතක් සඳහා රු. 100ක් තැන්පත් කිරීමෙනි.

5. කාර්යාල ඇර තබන නියමිත වේලාවන්හි දී මේ රන් පොලු සහ මුදු පරීක්ෂා කිරීමට හැකි ය.

6. ටෙන්ඩර් පත් ගෙනවිත් රේගු කාර්යාලයේ තබා ඇති පෙට්ටියෙහි තැන්පත් කළ හැකි ය. නො එසේ නම් රෙජිස්ටර් තැපෑලෙන් එවිය යුතුයි. කිසිම කරුණක් උදෙසා නියමිත කාලසීමාවෙන් පසුව ටෙන්ඩර් පත් භාරගනු නො ලැබේ.

7. ගැනුම්කරු විසින් මුළු මුදල ගෙවා රන් රන් රැගෙන යෑමට පෙර ගෘහ කර්මාන්ත දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ තුමාගෙන් ලබා ගත් බල පත්‍රය ඉදිරිපත් කළ යුතු වන්නේ ය.

8. ටැන්ඩර් පිළිබඳ අවශ්‍යතාවයන් සපුරා ඇති අයදුම් කරුවන් පුරවු පත් සඳහා තැන්පත් කරන ලද රු. 100ය; විකිණීම හමාර වූ පසු මේ කාර්යාලයෙන් පෙරලා ලබා ගැනීමට කුවිතාන්සිය සමග ඉල්ලුම් කළ යුතු යි.

9. කිසිදු හේතුවක් නො පෙන්වා ටෙන්ඩර් පත් එකක් හෝ වැඩි ගණනක් භාර නො ගැනීමට හෝ විකිණීම අවලංගු කිරීමට බලය රේගු ප්‍රධාන අයකැමි සතු ය.

ජේ. වී. පොන්සේකා,
ප්‍රධාන රේගු අයකැමි වෙනුවට.

අංකය : පී. ඕ.—සීඒපීඕ 3.

1958 දෙසැම්බර් මස 27 වැනි දින,
නිවාරණ අංශය,
කොළඹ රේගු දෙපාර්තමේන්තුවේදීය.

---

## ලඞකා ගමනාගමන මණ්ඩලය

### දැන්වීමයි

වයර සහ පියුබ් සැපයීම සඳහා එවන ටෙන්ඩර පත්‍ර කොළඹ 5, නාරාහේන්පිට කිරුළ පාරෙහි වූ ලඞකා ගමනාගමන මණ්ඩලීය සභාපති මහතා විසින් 1959 යේ පෙබරවාරි මස 25 වෙනි ද වන බදාදා පෙ. ව. 10 වන තෙක් බාරගනු ලැබේ.

2. ටෙන්ඩර පත්‍ර නියමිත ෆෝරම කොළවල පිටපත් අනුපිටපතකින් ද යුක්ත කොට එවිය යුතුයි. මේ ෆෝරම් කොළ බොරලැස්ගමුවේ වෙරහැර වූ ලඞකා ගමනාගමන මණ්ඩලීය ප්‍රධාන සම්පාදක නිලධාරි කායඹාලයෙන් 1959 යේ පෙබරවාරි මස 24 වෙනි ද වන අඟහරුවාද දවල් 12 වන තෙක් ලබාගත හැකිය. ඒවා ලබාගැනීමට රු. 500 ක ටෙන්ඩර මුදලක් තැන්පත් කළ විටය.

3. ප්‍රධාන සම්පාදක නිලධාරි කායඹාලයෙන් වැඩි විස්තර දැනගත හැකිය.

ලඞකා ගමනාගමන මණ්ඩලයේ
ලේකම්තැන.

1958 වේ දෙසැම්බර් මස 29 වෙනි දින,
කොළඹදීය.

2. හලාවත ආ. වැ. දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු තැනගෙන් පෝරම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනු පිටපතක්ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබා ගත හැකිය. සැලැස්මවල්ද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පුළුවන.

3. වෂී 1959යේ ජනවාරි මස 16 වෙනි සිකුරාද පස්වරු 4.30 වන තෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ වූ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 23,000ට නොඅඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියා පදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 25ක් තැන්පත් කර ලබා ගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කායඝාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ඊ. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක වෙනුවට ය.

කොළඹ, ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේදීය, 58.12.30.

---

පොලොන්නරු දිස්ත්‍රික්කයේ (1 වෙනි කොටස) ඇති රජයේ ගොඩනැගිලි 1959යේ වෂීය තුළදී අළුත් වැඩියා කිරීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වෂී 1959යේ ජනවාරි මස 21 වෙනි බදාදා පෙරවරු 10.30 වන තෙක් භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන එකී වේලාවේදී බදාදා පෙරවරු 10.30ට ටෙන්ඩර්කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. පොලොන්නරුවේ ආ. වැ. දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු තැනගෙන් පෝරම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනු පිටපතක්ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබා ගත හැකිය. සැලැස්මවල්ද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පුළුවන.

3. වෂී 1959යේ ජනවාරි මස 16 වෙනි සිකුරාද පස්වරු 4.30 වන තෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 23,000ට නොඅඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියා පදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 25ක් තැන්පත් කර ලබා ගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කායඝාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ඊ. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක වෙනුවට ය.

කොළඹ, ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේදීය, 58.12.30.

---

පොලොන්නරු දිස්ත්‍රික්කයේ (දෙවෙනි කොටස) ඇති රජයේ ගොඩනැගිලි 1959යේ වෂීය තුළදී අළුත් වැඩියා කිරීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වෂී 1959 යේ ජනවාරි මස 21 වෙනි බදාදා පෙරවරු 10.30 වන තෙක් භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන එකී වේලාවේදී බදාදා පෙරවරු 10.30ට ටෙන්ඩර්කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. පොලොන්නරුවේ ආ. වැ. දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු තැනගෙන් පෝරම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනු පිටපතක්ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබා ගත හැකිය. සැලැස්මවල්ද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පුළුවන.

3. වෂී 1959යේ ජනවාරි මස 16 වෙනි සිකුරාද පස්වරු 4.30 වන තෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 27,000ට නොඅඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියා පදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 50ක් තැන්පත් කර ලබා ගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කායඝාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ඊ. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක වෙනුවට ය.

කොළඹ, ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේදීය, 58.12.30.

---

කල්මුනේ දිස්ත්‍රික්කයේ ඇති රජයේ ගොඩනැගිලි 1959යේ වෂීය තුළදී අළුත් වැඩියා කිරීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වෂී 1959යේ ජනවාරි මස 21 වෙනි බදාදා පෙරවරු 10.30 වන තෙක් භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන එකී වේලාවේදී බදාදා පෙරවරු 10.30ට ටෙන්ඩර්කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. කල්මුනේ ආ. වැ. දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු තැනගෙන් පෝරම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනු පිටපතක්ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබා ගත හැකිය. සැලැස්මවල්ද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පුළුවන.

3. වෂී 1959යේ ජනවාරි මස 16 වෙනි සිකුරාද පස්වරු 4.30 වන තෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 20,000ට නොඅඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියා පදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 25ක් තැන්පත් කර ලබා ගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කායඝාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ඊ. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක වෙනුවට ය.

කොළඹ, ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේදීය, 58.12.30.

---

# බඩු බාහිරාදිය විකිණීම්

## ජාතික නිවාස දෙපාර්තමේන්තුව

### ප්‍රසිද්ධ වෙන්දේසියකි

මෙම දෙපාර්තමේන්තුවට අයත් මාලිගාවත්ත හදිසි නිවාස යෝජනා ක්‍රමයේ කඩා දමූ නිවාස වලින් ඉවත් කරන ලද ගොඩනැගිලි උපකරණ තොගයක් 1959 ජනවාරි මස 16 වන දින පෙරවරු 10ට එම ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ. මෙම උපකරණ සතියේ වැඩ කරන දිනයන් හිදී මාලිගාවත්ත නිවාස ක්‍රමයේ සේවයේ යුක්ත ඕවර්සියර් මහතාගේ අවසරය ඇතිව පරීක්ෂා කර බැලීමට හැක.

ඇම්. සෝමසුන්දරම්,
ප්‍රධාන ගණකාධිකාරී,
ජාතික නිවාස කොමසාරිස් තැන වෙනුවට.

ජාතික නිවාස දෙපාර්තමේන්තුව,
කොළඹ 1.

---

# විශේෂ නිවේදනයයි

1959 ජනවාරි 14 වැනි බදාදා ආණ්ඩුවේ නිවාඩු දිනයක් වන බැවින්, 1959 ජනවාරි 16 වැනි දින නිකුත්කරනු ලබන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා එවන සියළුම දැන්වීම් සහ නිවේදන, 1959 ජනවාරි 12 වැනි සඳුද පස්වරු 4 ට ප්‍රථම ආණ්ඩුවේ මුද්‍රණාලයට ලැබෙන්ට සැලැස්විය යුතු බව කාගේත් දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.

1958 දෙසැම්බර් 27 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය,
කොළඹ.

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

**දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා 1955 ජනවාරි 1 වැනි දින සිට අයකරණු ලබන සංශෝධිත ගාස්තු**

# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

(සෑම සිකුරාද දිනයන්හි පළ කරණු ලැබේ)

1. සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරණු ලබන්නේ **ප්‍රසිඬ කරන්නාගේ වගකීම පිටය.**

2. පෞද්ගලික පළ කරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශන, ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග **කොළඹ රජයේ මුද්‍රණාලයාධිපති** තැනට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ පුළුවන.

3. සතියේ දවස්වල පෙරවරු 9 සිට පස්වරු 4.30 දක්වා ද සෙනසුරාද දවස්වල පෙරවරු 9 සිට පස්වරු 1 දක්වාද කාර්යාලයේ කටයුතු කරන කාලය බව සැලකිය යුතුය.

4. සතියේ දවස්වල පස්වරු 3.30 ට සහ සෙනසුරාද දවල් 12ට මුදල් ගණුදෙනු කාලය අවසන් වේ.

5. **සියළුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි.** තැපෑලෙන් දැන්වීම් සහ ප්‍රකාශනයන් එවන විට, ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චැක් පතක් රජයේ මුද්‍රණාලයාධිපති නමට එවිය යුතුයි.

6. ප්‍රමාදය සහ දෙස් වලක්වා ගැනීම සඳහා, පළ කරන්ට නියමිත පිටපත **කඩදසියේ එක් පැත්තක පැහැදිලිව ලියා එවිය යුතුයි.** ටයිප් ගසා එවනවා නම් වඩාත් හොඳයි.

7. **සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.**

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හෝ, නමක් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් හෝ පළ කරණු නොලැබේ.

9. උසාවියේ අණ පනත් යටතේ නිකුත් කළායයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ පෙරකදෝරු මහතකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිඬ කරණු නො ලැබේ.

10. දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා 1955 ජනවාරි 1 වැනි දින සිට අය කරන ගාස්තු මෙසේයි :—

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 10 | 0 |
| වැඩිවන සෑම අඟලට හෝ ඉන් කොටසකට ... ... ... | 5 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... | 60 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... ... | 120 | 0 |

අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරණු ලබන ගාස්තුවම අය කරණු ලැබේ.

11. **සෑම සිකුරාද දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරණු ලැබේ.** ප්‍රසිඬ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරණ දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

12. ගැසට් පත්‍රය පළ කරන දින සිට කාර්යාලය වැඩ කරන දින තුනකට ප්‍රථම **පස්වරු 4ට** සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් **කොළඹ රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් අඟහරුවාද පස්වරු 4ට ප්‍රථමයෙන්).**

13. **ගැසට් පත්‍රය සඳහා දායක මුදල් වසකට හෝ ඉන් අඩකට කොළඹ රජයේ ප්‍රකාශන කාර්‍යාංශයේ අධිකාරි තැන විසින් කලින් භාරගනු ලැබේ.**

14. දායක මුදල් :—

| | | රු. | ශ. |
|---|---|---|---|
| වාර්ෂික දායක මුදල ... ... ... | එක් කාණ්ඩයක් සඳහා ... | 15 | 0 |
| | I වෙනි කාණ්ඩයේ එක් කොටසකට ... | 7 | 0 |
| සෑම කාණ්ඩයකම එක් කොටසක පිටපතකට ... ... | ... ... | 0 | 25 |
| | තැපැල් ගාස්තුවත් සමග | 0 | 31 |
| I වෙනි කාණ්ඩයේ එක් කොටසකට ... ... | ... ... | 0 | 10 |
| | තැපැල් ගාස්තුවත් සමග | 0 | 14 |

15. පරණ ගැසට් කොපි තිබේ නම් ඒ සඳහා ගාස්තුව දෙගුණයක් වේ. මෙය **කොළඹ, රජයේ ප්‍රකාශන කාර්‍යාංශයේ අධිකාරි තැනගෙන් ඉල්ලුම් කළ යුතුයි.**

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී